# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,868 — 1969 අගෝස්තු 22 වැනි සිකුරාද — 1969.8.22

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1447 | කොටුපල් රෝපද හා වෙනත් රෝපද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1458 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1458 | රථ බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | 1472 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1473 | විවිධ දැන්වීම ... ... | — |



## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසි වලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

(iv) තෝරා ගනු ලබන අයදුම්කරු පත්වීම ලබන දින සිට සතර අවුරුදු කාල සීමාවක් ඇතුළතදී සාමාන්‍ය ලිපිකාර සේවාවේ විධායක ලිපිකරු පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නියමිත සිංහල/දෙමළ ජාතික භාෂා පිළිබඳ පරීක්ෂණයකින් සාමර්ථ්‍යය ලැබිය යුතුය. එසේ කිරීමට අසමත්වීම පඩි වැඩිවීම විලම්බනය කිරීමට හේතුවේ. ඉඩදී ඇති කාලසීමාවට වඩා ගතවන වැඩිපුර කාලපරිච්ඡේදය පඩි වැඩිවීම විලම්බනය කළ කාලපරිච්ඡේදයක් ලෙස සලකනු ලබනවා ඇත.

(v) තෝරාගනු ලබන අයදුම්කරුගේ පත්වීම ස්ථිර කිරීමට පෙර ඔහුගේ ආධුනික/පරීක්ෂණ/වැඩ බැලීමේ කාලය තුළදී අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් සෑහීමකට පත්වන පරිදි පහත සඳහන් කරුණු සම්පූර්ණ කළ යුතු වේ:—

(අ) අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද පරිදි තෝරා ගන්නා ලද එක්තරා ප්‍රදේශයක ප්‍රාථමික හෝ ද්විතීයික මට්ටමේ අධ්‍යාපන පරිපාලනය/අධ්‍යාපන සැලැස්ම සහ සංවර්ධනය ගැන මෑතකවූ සංවර්ධනය පිළිබඳව විවේචනාත්මකව හැදෑරීම.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති හැදෑරීම පදනම් කොට, එසේ හදරන ලද දෑ වලින් ලත් පළපුරුද්ද ලංකාවට ගැලපෙන සේ යොදා ගත හැකි අයුරු සවිස්තරව දැක්වීම.

3. **වැටුප් සහ දීමනා :**

නව ප්‍රවේශකයන් සඳහා රු. 8,400 ක වාර්ෂික වැටුපකින් පටන්ගෙන රු. 480 වාර්ෂික වැටුප් වැඩිවීම් 10 කින් යුක්තව රු. 11,280 වාර්ෂික වැටුප මත අවුරුදු දෙකක් හා රු. 11,760 ට පෙර කාර්යක්ෂමතා කඩඉම ඇතිව රු. 13,200 දක්වා හා නව ප්‍රවේශක නොවන්නන් සඳහා පවුම් 600 ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන පවුම් 30 වාර්ෂික වැටුප් වැඩිවීම් 10 කින් යුක්තව වාර්ෂික වැටුප පවුම් 900 දක්වා නඟින වැටුප් ක්‍රමය මෙම තනතුරට හිමි වේ.

4. **අවශ්‍ය සුදුසුකම් :**

සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය:—

(අ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1965.9.5 වැනි දිනට අවුරුදු 30ට නො අඩු හා අවුරුදු 45ට නො වැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපායි.

(ඇ) වෘත්තීය තත්ත්වයේ හෝ පූර්ව වෘත්තීය තත්ත්වයේ කාර්මික අධ්‍යාපනය පිළිබඳ අවුරුදු 10 කට නො අඩු පරිපාලන පළපුරුද්දක් සහ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් තිබීම; හෝ

(ඈ) (i) එක්සත් රාජධානියේ යාන්ත්‍රික ඉංජිනේරු පිළිබඳ උසස් ජාතික සහතිකය හෝ ඩිප්ලෝමාව තිබීම; හෝ,

(ii) ලන්ඩනයේ සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ සම්පූර්ණ කාර්මික සහතිකය තිබීම ; හෝ,

(iii) ඊට සමාන හෝ උසස් සහතිකයක් තිබීම ; සහ අවුරුදු 15 කට නො අඩු වෘත්තීය හා/හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම,

(ඉ) ජ්‍යෙෂ්ඨ/අ.පො.ස. විභාගයේදී හෝ වෙනත් උසස් විභාගයකදී තමන් රාජකාරි කරන භාෂාවෙන් සාහිත්‍යය හෝ භාෂාව පිළිබඳ ප්‍රශ්න පත්‍ර වලින් සමර්ථ වී තිබීම,

(ඊ) අධ්‍යාපන උපදේශකවරයෙකු වශයෙන් අවුරුදු 3 කට හෝ 1 වැනි ශ්‍රේණියේ විදුහල්පති වරයෙකු වශයෙන් හෝ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයක විදුහල්පති වරයෙකු වශයෙන් අවුරුදු 5 කට හෝ නො අඩු සේවයක් ඇත්තෙකු වීම,

(උ) හස්ත කර්මාන්ත ඉගැන්වීමෙහි හා/හෝ පාලනයෙහි යටත් පිරිසෙයින් දස වර්ෂයක පළපුරුද්දක් තිබීම.

**සංලක්ෂ්‍යය.**—කාර්මික අධ්‍යාපනයට සම්බන්ධ අවුරුදු 10ක මුළු සේවා කාලයක් ඇති අධ්‍යාපන උපදේශක තත්ත්වයේ නිලධාරීන් හෝ කාර්මික අධ්‍යාපනයට සම්බන්ධ ජ්‍යෙෂ්ඨ (වෘත්තීය) උපදේශකයින්ගේ තත්ත්වයේ සිටින අවුරුදු 15 කට නො අඩු මුළු සේවා කාලයක් ඇති කාර්මික ආයතනවල අයටද මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතිස්ම සහතික භාරගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය,

(සී) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ විය යුතුයි,

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික,

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික,

(එෆ්) 4 (ඉ) (ඊ) හා (උ) ඡේදවල දක්වා ඇති සුදුසුකම් ඔප්පුකිරීම සඳහා අවශ්‍ය සහතික.

සැ. යු.—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුයි.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමඟ තමන්ට එවන ලද (බී සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද (''ඒ'' සලකුණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔහුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔහුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදෙර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ.පෙ. 500.

8—1127/1—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒඒ.69/එක්ස්.2126/69

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### යාන්ත්‍රික අධිකාරි තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම් පත්‍ර කැඳවමින් අංක 14,865 හා 1969 අගෝස්තු මස 1 වැනි දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කළ අංක ඒඒ. 69/එක්ස්.2126/69 හා 1969 ජූලි මස 25 වැනි දිනැති නිවේදනය සම්බන්ධයි.

2. මෙම තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1969 අගෝස්තු මස 29 වැනි දින දක්වා දීර්ඝ කළ බව මහජන දැන ගැනීම පිණිස මෙයින් දන්වනු ලැබේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අගෝස්තු මස 15 වැනි දින.
කොළඹ 1, ගාලු මුවදෙර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී,
තැ. පෙ. අංක 500.

8—1127/2—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

අංකය : ඊ.බී. 74/එක්ස්. 2130/69.

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### ප්‍රධාන ගමනාගමන පිරිවැය නිලධාරි තනතුර

ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගමනාගමන පිරිවැය නිලධාරි තනතුර පිළිබඳ අංක 14,867 හා 1969 අගෝස්තු මස 15 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළකළ අංක : ඊ.බී. 74/එක්ස්.2130/69 හා 1969 අගෝස්තු මස 8 වැනි දින දරණ නිවේදණය සම්බන්ධයි.

2. මෙරට ඉල්ලුම් පත්‍ර 1969 අගෝස්තු මස 20 වැනි දින නොව අගෝස්තු මස 29 වැනි දින දක්වා භාරගන්නා බව මහජන දැනගැනීම පිණිස මෙයින් දන්වනු ලැබේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අගෝස්තු මස 19 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායර්‍යාලයේ දීය.
කොළඹ 1,
තැ. පෙ. 500.

8–1257—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## යුද හමුද දෙපාර්තමේන්තුව

### පුද්ගලික සහකාර තනතුර

ලංකා යුද හමුද ආඥපති යටතේ පුද්ගලික සහකාර තනතුරක් සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම් පත් කැඳවනු ලැබේ. අයදුම්කරුගේ අත් අකුරින් පිළියෙල කරන ලද අයදුම් පත් පහත සඳහන් ආකෘති පත්‍රය ප්‍රකාර විය යුතු ය. අයදුම්පත්, කොළඹ 3, තැ. පෙ. 553, යුද හමුද මූලස්ථාන යේ සිවිල් පාලක ගණකාධිකාරී වෙත 1969.9.12 දිනට හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

2. **වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 3,600 — 156 රු. 4,692 කි.

3. **වයස් සීමාව.**—වයස අවුරුදු 23 ට නො අඩු හෝ අවුරුදු 40 ට නො වැඩි විය යුතු ය. දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත අයදුම් කරුවන්ට වැඩි වයස් සීමාව බලපාන්නේ නැත.

4. **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—(i) සෑම අයදුම්කරුවෙකු විසින් ම තමා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊ හා සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත් වී ඇති බවට පිළිගත හැකි සාධක ඉදිරි පත් කළ යුතු ය.

(ii) අයදුම්කරුවන් හට ඉංග්‍රීසි ලඝු ලේඛණය පිළිබඳව විනාඩියකට වචන 120 කට නො අඩු වේගයක් තිබිය යුතු අතර, විනාඩියකට වචන 40 කට නො අඩු වේගයකින් ටයිප් කිරීමට හැකියාවක් තිබිය යුතු ය. දෙනු ලබන උපදෙස් අනුව ඕනෑම අවස්ථාවකට ලිපිවලට පිළිතුරු කෙටුම් පත් කිරීමට ද හැකියාවක් තිබිය යුතු ය.

(iii) ලේඛක කටයුතු පිළිබඳව පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(iv) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුත් අය විය යුතු ය.

5. **බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දයක මුදල් ගෙවිය යුතු ය. තනතුර සඳහා ස්ත්‍රියක පත්කර ගනු ලැබීමේ දී ඇය විසින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දයක මුදල් ගෙවිය යුතු අතර, ඇය අංක 372 හා 1957.4.29 දින දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව විශ්‍රාම වැටුප් සහිත තත්ත්වය ලැබීමට හිමිකාරිය වනු ඇත.

6. **සේවයේ කොන්දේසි.**—රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා නව ප්‍රවේශයකු නම් :—

(i) ඔවුන්ගේ ආධුනික/පරීක්ෂණ කාලය අවුරුදු 3 ක් විය යුතු ය.

(ii) ඔහු/ඇ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූත් හෝ මතුවට පනවනු ලැබිය හැකි වූ හෝ යම් නිති‍රීති වලට සහ ව්‍යවස්ථා වලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතු ය.

(iii) ඔහුගේ/ ඇගේ ආධුනික/පරීක්ෂණ කාලය තුළ දී රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමට සෑහෙන දැනුමක් ලබා ගත යුතු ය.

(iv) ආධුනික/පරීක්ෂණ කාලය අවසානයේ දී පත්වීම ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, පත්වීමේ දිනයේ සිට පිළිවෙලින් අවුරුද්දක්, අවුරුදු 2 ක් සහ අවුරුදු 3 ක් ඇතුළත I වැනි ශ්‍රේණියේ II වැනි ශ්‍රේණියේ සහ III වැනි ශ්‍රේණියේ පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාල සීමාවක් තුළ දී නියමිත පරීක්ෂණයන්ගෙන් සමත් නොවුවහොත් එය ඔහුගේ වැටුප් වැඩිවීම අත්හිටුවීමට හේතු වේ. නියමිත කාල යෙන් පසු තවත් සයමසක් ගත්වන්නට පෙර පරීක්ෂණයෙන් සමත් නොවුවහොත් වැටුප් වැඩිවීම අත්හිටුවීම, වැටුප් වැඩිවීම නතර කිරීමකට පරිවර්තනය කර, පරීක්ෂණය සමත් වන තෙක් හෝ මෙහි පහත (v) වැනි අංකය යටතේ ඇති විධිවිධාන අදාල වන කාලය වන තෙක් හෝ එම නතර කිරීම ක්‍රියාත්මකව තබනු ඇත.

(v) ආධුනික/පරීක්ෂණ කාලය අවසාන් වන විට නියමිත සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගතහොත් අංක 120 හා 121 යන පරිපාලන රෙගුලාසිවල කොන්දේසි අදාලවනු ඇත.

(ඉහත සඳහන් (iii), (iv) හා (v) යන කොන්දේසි ඉංග්‍රීසි මාධ්‍ය යෙන් සේවයට බඳවාගනු ලැබූවන්ට අදාල වේ.)

7. අයදුම්කරුවන් විසින් තමන් ගේ අයදුම් පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය. (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨ ශාලා රීති සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරනු ලැබූ සහතික හෝ භාරගනු නො ලැබේ)

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික හා අංක 4 (ii) හා (iii) යන ඡෙදවල සඳහන් සුදුසුකම් පිළිබඳ සහතික.

(iii) අයදුම්කරුගේ චරිතය හා සුදුසුකම් පිළිබඳව ලඟදී ලබාගන්නා ලද සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් විසින් එවැනි සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍ය ය.)

**සැළකිය යුතුයි.**—සහතික පත්‍රවල හා චරිත සහතිකවල පිටපත් ආපසු එවනු නො ලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡෙදයේ ආරම්භයේ පළකර තිබෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් පිළිබඳ පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

9. රාජ්‍ය සේවයෙහි නියුක්ත නිලධාරීන්ගේ අයදුම් පත් ඒ ඒ දෙපාර්ත මේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. එසේ දෙපාර්ත මේන්තු ප්‍රධානීන් විසින් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, කෙටි දැන්වීමකින් පසු අයදුම්කරු පත්වීම භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කළ හැකි දයි සඳහන් කළ යුතුයි.

10. කොළඹ දී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට සහ විභාගයකට ඉදිරිපත්වීම සඳහා අයදුම්කරුවන් සූදනම් වී සිටිය යුතු ය. මේ සඳහා ගමන් වියදම් ගෙවනු නො ලැබේ.

ඇම්. නඩරාජා,
වැ. බ. සිවිල් පාලක හා ගණකාධිකාරී,
යුද හමුදව.

1969 අගෝස්තු මස 15 වැනි දින,
යුද හමුද මූලස්ථානය, තැ. පෙ. 553,
කොළඹ 3.

### පුද්ගලික සහකාර තනතුර සඳහා අයදුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
   (අ) අගට යෙදෙන නම :————.
   (ආ) අනිත් නම් :————.
2. ලිපිනය :————.
3. ජාතිය හා ජාතිකත්වය ලැබූ පිළිවෙල :————.
4. (අ) උපන් දිනය හා ස්ථානය :————.
   (ආ) 1969.9.12 දිනට නියම වයස :————.
5. ස්ත්‍රී පුරුෂ භාවය :————.
6. විවාහක ද නැතහොත් අවිවාහක ද යන වග :————.
7. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.
8. පළපුරුද්ද පිළිබඳ විස්තර (දැන්වීමේ 4 (ii) හා (iii) ඡෙද බලන්න) —.
9. දනට කරන රක්ෂාව (ඇතොත්) :————.
10. චරිත සහතික ලබාගත් දෙදෙනාගේ නම් සහ තනතුරු :—
    (1) ————.
    (2) ————.
11. විශේෂ සුදුසුකම්, හිමිකම් ආදිය ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8—1132—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි (කෘෂිකර්ම) තනතුරු

ඉහත සඳහන් තනතුරු ප්‍රසිද්ධ කරමින් අංක 14,865 හා 69.8.1 වැනි දින දරණ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡෙදයේ පළවූ නිවේදනය කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

2. යථෝක්ත තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර බාරගන්නා අවසාන දිනය 1969.8.31 දක්වා දීර්ඝ කරන ලදී.

ස්ථිර ලේකම් හා
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

අංක : සාප. 25/8
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය,
මැලේ වීදිය,
කොළඹ 2.
1969 අගෝස්තු 14 දින.

8–1024—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : සාප/30/223.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### සහකාර පුස්තකාලයාධිපති තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969 සැප්තැම්බර් මස 6 වැනි දින හෝ ඊට ප්‍රථම කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ස්ථිර ලේකම්ට ලැබෙන සේ එවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(i) තනතුර තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයකු නම් ආධුනික කාලසීමාව අවුරුදු 3ක් වන්නේය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක ස්ථිර කරනු ලැබ සිටින නිලධාරියකු තෝරාගනු ලැබුවහොත් ඔහුගේ පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ පදනම මතය.

(iv) පත්කරනු ලබන්නා තමාට නියම කරනු ලබන දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

(v) බඳවාගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය, වාර්ෂිකව රු. 1,320—19 × 72—රු. 2,688 යි. රජයේ නීති රීති අනුව ගෙවල් කුලී දීමනා, ජීවනාධාර දීමනා හා විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරිම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි:—

(අ) සෑම අයදුම්කරුවෙක්ම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍ය කාර්යාල යේ හෝ අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් දෙපාර්තමේන්තු යටතේ හෝ සේවය කරන්නකු විය යුතුයි.

(ආ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 20ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නො ලැබේ.)

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අංක ගණිතය/ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 6 කින් දෙවරකට නො වැඩි වාර ගණනකදී ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්වී සිටිය යුතුය.

(ඈ) පුස්තකාල වැඩ පිළිබඳව අවුරුදු 5ක පළපුරුද්දක් තිබිය යුතුය.

(ඉ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්තව සිටිය යුතුය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක්ම සූදනම් විය යුතුය:—

(අ) ලැබූ ඉහලම අධ්‍යාපන සහතිකය ;

(ආ) පුස්තකාල වැඩ පළපුරුද්ද සම්බන්ධයෙන් සහතික ;

(ඇ) ලබා ඇති වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

**සටහන.**—(i) ලිය කියවිලිවලත්, ලියවිලි වල පිටපත්වත් අයදුම්පතට අමුණා නොඑවිය යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්ත මේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත් තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කෙළින්ම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ යේ ස්ථිර ලේකම්ගේ නමට ද එවිය යුතුයි. නියමිත දිනට ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේ දී දෙපාර්ත මේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් එසේ ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් බාරගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡෙදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරු වලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. ඉල්ලුම්පත් ලැබුනු බව දන්වනු ඇත. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනය පසුවී දින 14ක් ඇතුළත ඉල්ලුම්පත ලැබුණු බවට ලිපියක් නොලදහොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමිවනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේ දීය.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**මෙම ඉල්ලුම් පත්‍රය අඟල් 8 1/2 × 13 1/2 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළයුතුයි.**

### අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය—සහකාර පුස්තකාලයාධිපති තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ස්ථිර ලිපිනය :————.

3. ගම් ප්‍රදේශය :————.

4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට නියම වයස :————.
උපන් දිනය :————.

5. උපන් ස්ථානය :
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේත් පියා :————.

6. ලාංකිකත්වය පරම්පරාවෙන්ද, ලියාපදිංචි කිරීමෙන්ද යන වග :————

7. අධ්‍යාපන සුදුසුකම් :—
   (i) සාමාන්‍ය :————.
   (ii) පුස්තකාල වැඩ පළපුරුද්ද පිළිබඳ සහතිකවල විස්තර :——.
   (iii) සිංහලෙන්/දෙමළෙන් සමත්වී ඇති උසස්ම විභාගයේ විස්තර :————.

8. නිවේදනයේ 4 වැනි ඡෙදයේ (ඇ) යටතේ සේවා විස්තර :————.
(සේවය කළ ආයතන, සේවා කාලයත්, දැරූ තනතුර සඳහන් කළයුතුයි)

9. විවාහකද ? අවිවාහක ද? වැන්දඹු ද ? :————.

10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේනම්, (අ) දිනය (ආ) නඩු නොම්මරය (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

11. මුදල් කරදර වලින් නිදහස් ද ? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණ ද ? :————.

12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේනම් ඒ පිළිබඳ විස්තර :————.

13. සේවා මුක්ත හටයෙක් වී නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුණු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

14. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකිරක්ෂා :
   (i) දරන ලද තනතුර :————.
   (ii) නියුක්තව සිටි වකවානුව :————.
   (iii) අස්වීමට හේතුව :————.

15. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ හෝ කළින් ස්ථිර හෝ තවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්—

(අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.
(ආ) සේවයේ යෙදී සිටි කාලය :————.
(ඇ) සේවය නතර කිරීමට හේතු :————.

16. දැනට යෙදී සිටින රක්ෂාව :

(i) ආයතනය :————.
(ii) තනතුර හා ශ්‍රෙණිය :————.
(iii) ඊට පත් වූ දිනය :————.
(iv) විශ්‍රාම වැටුප් සහිත ද? තාවකාලික හෝ අනියම්ද ?:————
(v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය :————.
(vi) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

17. වෙනත් කරුණු :————.

18. මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුව හොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය

මගේ අංකය :
ඔබේ අංකය : සාප/30

අධ්‍යා. සං/ලේ.,

මෙම අයදුම් පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුය./පෙරය.*

ඉල්ලුම් පත්‍රයේ සඳහන්.................අංකිත ඡෙදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව්* මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

..................................

..................................

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

පදවි නාමය :————.

දිනය :————.

(*අදාල නැති කොටස් කපා හරින්න.)

8–1124—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කාර්මික සහකාර තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්මික සහකාර තනතුරු සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969 සැප්තැම්බර් මස 13 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ස්ථිර ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම් පරීක්ෂා කාල සීමාව අවුරුදු 3ක් වන්නේ ය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නෙකු තෝරා ගනු ලැබුව හොත් පත්වීම නියමිත කාලයකට වැඩ බැලීමේ පදනමක් මත වේ.

(iv) පත් කරනු ලබන්නා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය.

(v) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මගිනි.

3. **වැටුප් හා දීමනා.**—වර්ෂයකට රු. 1,620න් පටන් ගෙන රු. 120 බැගින් වන වාර්ෂික වැඩිවීම් 18 කින් වර්ෂයකට රු. 3,780 දක්වා නගින්නකි. රු. 2,820 වාර්ෂික වැටුප් වැඩිවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

රජයේ නීති රීති අනුව ජීවනාධාර දීමනා, විශේෂ ජීවනාධාර දීමනා සහ ගෙවල් කුලී ද ගෙවනු ලැබේ.

4. **සුදුසුකම්.**—(i) දෙපාර්තමේන්තු සේවකයින් :—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු වෙයි.

(අ) අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික අධ්‍යාපන ආයතනයක සේවය කරන්නෙකු විය යුතුය.

(ආ) 4 (ii) වැනි ඡෙදයෙහි සඳහන් සුදුසුකම් තිබිය යුතුයි.

(ii) බාහිර අයදුම්කරුවන් :—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු වෙයි.

(අ) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 35ට නො වැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නො ලැබේ.)

(ආ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත විය යුතුය.

(ඇ) දෙවාරයකට නො වැඩි වාර ගණනක දී රසායනික විද්‍යාව, භෞතික විද්‍යාව, ගණිතය ( ශුද්ධ හෝ ව්‍යවහාරික) සහ ජීව විද්‍යාව ඇතුළු විෂයයන් 6 කින් පොදු අධ්‍යයන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් හෝ රසායනික විද්‍යාව, භෞතික විද්‍යාව, ගණිතය ( ශුද්ධ හෝ ව්‍යවහාරික) සහ ජීවන විද්‍යාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටිය යුතුය.

(ඈ) ලී වැඩ යන්ත්‍ර, ලෝහ වැඩ යන්ත්‍ර ක්‍රියා කරවීම, අන්වීක්ෂ විදුලි මිණුම් උපකරණ, රසායනික තුලා, විරාම ඝටිකා, ආදී විද්‍යා උපකරණ අළුත්වැඩියා කිරීම හා විදුලි මිණුම් උපකරණ පරීක්ෂණය හා ප්‍රමාණ ශෝධනය, ඒසී සහ ඩීසී විදුලි මෝටර් ආමිචර් එතීම සහ වීදුරු බුබුළු පිඹීම, පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු තුනක පළපුරුද්දක් තිබීම.

රජයේ කාර්මික ආයතනයක, කාර්මික පුහුණුවක් ලබා කණිෂ්ඨ කාර්මික නිලධාරි (ජේ.ටී.ඕ.) සහතික ලබාගෙන ඇති අයදුම් කරුවන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**සටහන්.**—බාහිර අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ගැන සලකා බලනුයේ දෙපාර්තමේන්තු සේවකයින් නොමැති නම් පමණකි.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙකුම සූදානම් විය යුතුය :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අධ්‍යයන පොදු සහතිකය ;
(ආ) 4(ii) ඡේදයේ සඳහන් සහතික පත්‍ර ;
(ඇ) සිංහලෙන් සමත් වී ඇති ඉහළම විභාගය දැක්වෙන සහතිකය ;
(ඈ) උප්පැන්න සහතිකය.

සටහන.—

(i) ලියකියවිලිවත්, ලියකියවිලිවල පිටපත්වත් අයදුම්පතට අමුණා නො එවිය යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ගැන සළකා බලනු නො ලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේදී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් එසේ ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් බාර ගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡෙදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. ඉල්ලුම් පත් ලැබුන බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත් බාර ගන්නා අවසාන දිනය පසුවී දින 21 ක් ඇතුළත ඉල්ලුම් පත ලැබුණ බවට ලිපියක් නො ලද හොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම් කරුවෙකු මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම් පත්‍රය සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ,
සාමාන්‍ය පරිපාලන ශාඛාවේ දී ය.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ස්ථිර ලිපිනය :————.

3. ගම් ප්‍රදේශය :————.

4. අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට නියම වයස :————.
උපන් දිනය :————.

5. උපන් ස්ථානය :————.
   - (අ) ඉල්ලුම්කරු :————.
   - (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
   - (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
   - (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

6. ලාංකිකත්වය පරම්පරාවෙන් ද, ලියා පදිංචි කිරීමෙන් ද යන වග :——.

7. අධ්‍යාපන සුදුසුකම් :————.
   - (i) සාමාන්‍ය :————.
   - (ii) වෘත්තිය හා/හෝ කාර්මික සහතිකවල විස්තර :————.
   - (iii) සිංහලෙන්/දෙමළෙන් සමත් වී ඇති උසස් ම විභාගයේ විස්තර :————.

8. නිවේදනයේ 4 වැනි ඡෙදයේ (ii) (ඈ) අනුඡෙදය යටතේ සේවා විස්තර (සේවය කළ ආයතන, සේවා කාලයත්, දරූ තනතුර සඳහන් කළ යුතුයි) :————.

| තනතුර | සේවය කළ ආයතනය | සේවා කාලය | | අස්වීමට හේතුව |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |

9. විවාහක ද, අවිවාහක ද, වැන්දඹු ද ? :————.

10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේනම් :—
    - (අ) දිනය :———— (ආ) නඩු නොම්මරය :————.
    - (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

11. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නොවේ නම්, ඔබ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණ ද ? :————.

12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේ ද ? එසේ නම් ඒ ඒ පිළිබඳ විස්තර :————.

13. සේවා මුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුනු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තරය :————.

14. පාඨශාලාවෙන් අස් වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :————.
    - (i) දරන ලද තනතුර :————.
    - (ii) නියුක්තව සිටි වකවානුව :————.
    - (iii) අස්වීමට හේතුව :————.

15. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටි, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් :—
    - (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.
    - (ආ) සේවයේ යෙදී සිටි කාලය :————.
    - (ඇ) සේවය නතර කිරීමට හේතු :————.

16. දැනට යෙදී සිටින රක්ෂාව :————.
    - (i) ආයතනයේ නම :————.
    - (ii) තනතුර හා ශ්‍රේණිය :————.
    - (iii) ඊට පත් වූ දිනය :————.
    - (iv) විශ්‍රාම වැටුප් සහිත ද " තාවකාලික හෝ අනියම් ද ?:————.
    - (v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය:————.
    - (vi) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

17. වෙනත් කරුණු :————.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් කෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මගේ අංකය : සාප.30/182
ඔබේ අංකය :

අධ්‍යා.සං/ලේ.

මෙම අයදුම් පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම් පත් බාර ගන්නා අවසාන දිනට පසුය/පෙරය.*

ඉල්ලුම් පත්‍රයේ..................අංකික ඡෙදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව්* මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

..........................................

..........................................

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ
අත්සන.

පදවි නාමය :————.

දිනය :————.

*අදල නැති කොටස් කපා හරින්න

8–1125—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/2/189

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1970 හවායි විශ්ව විද්‍යාලයීය ශිෂ්‍යත්ව

හවායි විශ්ව විද්‍යාලයේ පහත සඳහන් ක්ෂේත්‍රයයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා පෙර-අපර දෙදිග සංස්කෘතික හා කාර්මික අන්තර් හුවමාරු මධ්‍යස්ථානය විසින් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ :—

- පුස්තකාල විද්‍යාව
- අධ්‍යාපන විද්‍යාව
- භූගෝල විද්‍යාව
- භූගර්භ විද්‍යාව
- ආර්ථික විද්‍යාව
- ව්‍යාපාර පරිපාලනය
- සිවිල් ඉංජිනේරු විද්‍යාව
- විදුලි ඉංජිනේරු විද්‍යාව
- ගණිතය
- භෞතික විද්‍යාව
- රසායන විද්‍යාව
- උද්භිද විද්‍යාව
- සත්ව විද්‍යාව
- කීට විද්‍යාව
- ක්ෂුද්‍රජීව විද්‍යාව
- ධීවර ජීව විද්‍යාව
- ජීව රසායන විද්‍යාව
- ජීව භෞතික විද්‍යාව
- කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව
- කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව
- ශස්‍ය විද්‍යාව
- උද්‍යාන විද්‍යාව
- පස පිළිබඳ විද්‍යාව
- මානව උත්පාදන විද්‍යාව
- භෛෂජ්‍ය විද්‍යාව

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකිමනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍රලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂය 2.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂය 3.**—එක් අයදුම් කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් මාස 9 සිට මාස 24 දක්වා වන්නේය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ හවායි බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක

ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්ව ධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේය.

3. **සුදුසුකම්.**—අයදුම් කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(ii) 1969.9.1 වැනි දිනට, වයස අවුරුදු 21 හා 35 අතර විය යුතුයි.

(iii) යටත් පිරිසෙයින් පිළිගත් විශ්ව විද්‍යාලයයකින් ලබාගත් දෙවැනි පෙළ උපාධියක් තිබිය යුතුයි.

(iv) ඇමෙරිකානු විශ්ව විද්‍යාලයයක කලින් ඉගෙනගත් කෙනෙකු නොවිය යුතුයි.

(v) උසස් ඉංග්‍රීසි ප්‍රවීනත්වයක් තිබිය යුතුයි. (මේ ශිෂ්‍යත්ව සඳහා නාම යෝජනා කිරීම පිණිස තෝරාගනු ලබන අපේක්ෂකයන් විදේශීය භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පරීක්ෂණයකට පෙනී සිටීමට සූදානම් වී සිටිය යුතුය. මේ පරීක්ෂණය මූලික වශයෙන් විදේශීය ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි ප්‍රවීණත්වය නිශ්චය කිරීම පිණිස ඇතුල්වීමේ පරිපාටියේ කොටසක් හැටියට පිළියෙල කරන ලද්දකි. එය පැය තුනහමාරක් තිස්සේ එක් වරකදී කොළඹ දී පැවැත්වේ. මේ සම්බන්ධයෙන් ඩොලර් 10 ක ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් ගෙවිය යුතු අතර එය පරීක්ෂණයට පෙනී සිටින අපේක්ෂකයන් විසින්ම දැරිය යුතුව ඇත. කෙසේ වෙතත් පරීක්ෂණයට පෙනී සිටින අවස්ථාවකදී එම ගාස්තුව ගෙවීම අපේක්ෂා නොකෙරේ. අපේක්ෂකයන් ශිෂ්‍යත්ව සඳහා අවසාන වශයෙන් තෝරා ගනු ලැබුවහොත් පමණක් ඔවුන්ට ගෙවන දීමනාවන්ගෙන් ඩොලර් 10 ක් පෙර-අපර දෙදිග මධ්‍යස්ථානය විසින් හවායිහිදි අඩු කරගනු ඇත. පරීක්ෂණය පිළිබඳ විස්තර අපේක්ෂකයන් වෙත යථා කාලයේ දී දන්වා එවනු ලැබේ.)

**සංලක්ෂ්‍යය 1.**—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1969.9.1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂ්‍යය 2.**—එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන්ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) හවායි බලා යාම සහ ආපසු පැමිණීම සඳහා ගමන් පහසුකම්.

(ආ) ඉගැන්වීම හා පොත්පත්.

(ඉ) ආහාර සඳහා දීමනාවක් හා නවාතැන්.

(ඊ) සෞඛ්‍ය රක්ෂණය.

(උ) සුලු පෞද්ගලික දීමනාවක්.

**සංලක්ෂ්‍යය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතින්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපෙක්ෂකයන් හවායි බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු, අවශ්‍ය වුවහොත්, රජය විසින් සියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපෙක්ෂකයන් හවායිහි අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මඟින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරාගැනීමේන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපෙක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1969.9.5 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම් කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 අගෝස්තු මස 15 වැනිද,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

8–1123—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි (ගෘහ විද්‍යාව) තනතුරු—සිංහල/දෙමළ

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි (ගෘහ විද්‍යාව) තනතුරු සඳහා මෙහි පහත සඳහන් සුදුසුකම් ලබා ඇති අපේක්ෂිකාවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත සඳහන් කරනු ලබන ආකෘතියට අනුව එවිය යුතු ඉල්ලුම්පත් 1969 සැප්තැම්බර් මස 10 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, සාමාන්‍ය පරිපාලන ශාඛාවේ ස්ථිර ලේකම් වෙත එවිය යුතුයි.

2. **සේවයට බඳවා ගැනීමේ නියමයන්.**—(i) මෙම තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. කෙසේ වෙතත් මුල් පත්වීම අර්ථසාධක අරමුදලේ වරප්‍රසාද ලැබීමේ පදනම මත වේ. ඒ සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂිකාවන් විසින් ඔවුන්ගේ වැටුපෙන් සියයට පහක දායක මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුය. දස වසක මුළු සේවා කාලය සම්පූර්ණ කිරීමට ප්‍රථම ඕනෑම අවස්ථාවකදී නිලධාරිනියක් විසින් තවදුරටත් අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවන්නේද, විශ්‍රාම වැටුප් ක්‍රමයට මාරු කළයුතු ද යන්න ගැන සිය මනාපය දක්වා සිටිය යුතුය. ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ විශ්‍රාම වැටුප් හිමි ගුරුවරියක ලෙස හා/හෝ රජයේ අර්ථසාධක අරමුදල් හිමි

තනතුරක ඇය දැනටමත් දස වසක සේවාවක් සම්පූර්ණ කර තිබේ නම් මෙම පත්වීම ලැබී මාස 6ක් තුළදී සිය මනාපය පළ කළ යුතුය.

(ii) මුල් අවස්ථාවේදී පත්වීම ලබා අවුරුදු තුනක් ගතවන තුරු ආධුනික තත්ත්වයේ සිටිය යුතුය. දැනටමත් විශ්‍රාම වැටුප් හිමි ස්ථිර තනතුරක් දරන නිලධාරිනියක තෝරා ගනු ලැබුවහොත් ඇ නියමිත කාලසීමාවක් සඳහා මෙම තනතුරෙහි වැඩ බැලීම පිණිස පත් කරනු ලැබේ.

3. **සේවා කොන්දේසි.**—(I) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් රජයේ සේවයට බැඳුනු නව ප්‍රවේශකයෙක් නම් :

(i) ප්‍රවාසන/පරීක්ෂා කාලය අවුරුදු 3 යි.

(ii) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනටම පනවා ඇති හා මින් මතුවට පනවනු ලබන ව්‍යවස්ථාවලට අනුකූලව ඇය ක්‍රියා කළ යුතුය.

(iii) ඇය නියමිත ප්‍රවාසන/පරීක්ෂණ කාලය ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

(iv) ප්‍රවාසන/පරීක්ෂා කාල පරිච්ඡේදය ගතවී අවසන් වූවාට පසු සේවයේ ස්ථිර කරනු ලබන්නේ වෙනත් කරුණු අතර නියමිත සිංහල ප්‍රවීනතා පරීක්ෂණ වලින් නියමිත කාල සීමාව ඇතුළත ඔවුන් සමත්වීම මතය. නියමිත කාල සීමාවක් ඇතුළත මෙම පරීක්ෂණ වලින් සමත්වීමට අපොහොසත් වුවහොත් එහි ප්‍රතිඵලය වන්නේ වැටුප් වැඩිවීම අත්හිටවනු ලැබීමයි. නියමිත කාල සීමාවෙන් මාස 6 ක් ගතවීමෙන් පසුවත් පරීක්ෂණයෙන් සමත් නොවුනි නම් වැටුප් වැඩිවීම අත්හිටුවීම නතර කිරීමකට පරිවර්තනය වී පරීක්ෂණයෙන් සමත් වන තෙක් එය ක්‍රියාත්මක වනු ඇත.

(v) ප්‍රවාසන/පරීක්ෂා කාල පරිච්ඡේදය අවසානයේදී නියමිත සිංහල ප්‍රවීනතා තත්ත්වයට නොඑළඹුනහොත් ලංකාණ්ඩුවේ කාර්ය සංවිධාන සංග්‍රහයේ 120 හා 121 වගන්තිවල විධි විධානයන්ට අදාලව ක්‍රියා කරනු ඇත. ඉහත සඳහන් iii, iv සහ v අංකිත කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයෙන් බඳවා ගන්නා ලද අය කෙරේ අදාල වනු ඇත.

(II) (i) තෝරාගනු ලැබූ අයදුම්කරු දෙවන කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්වීමට පෙර විධායක ලිපිකරු පන්තියේ දෙවන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නියමිත ජාතික භාෂා විභාගයේදී (දෙමළ නිලධාරීන්) සිංහලෙන් ද (සිංහල නිලධාරීන්) දෙමළෙන් ද සාමාර්ථය ලැබිය යුතුය. දෙවන කාර්යක්ෂමතා කඩඉම පසුකළ නිලධාරීන් තෙවන කාර්යක්ෂමතා කඩඉම පසුකිරීමට පෙරාතුව ඉහත සඳහන් විභාගයෙන් සාමාර්ථයක් ලැබිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් වැටුප් වැඩිවීම විලම්බනය කිරීම එහි ප්‍රතිඵලය වන්නේය. මෙම විභාගයෙන් සාමාර්ථය ලැබීමට ඉඩ දී ඇති කාලසීමාවට වැඩි කාලයක් ගතවී සාමාර්ථය ලැබූවිට එසේ ගතවූ වැඩිකාල පරිච්ඡේදය පඩි වැඩිවීම විලම්බනය කළ කාල පරිච්ඡේදයක් ලෙස සලකනු ඇත.

(ii) තෝරාගනු ලැබූ අයදුම්කරු පත්වීම ලැබූ දින සිට තුන් අවුරුදු කාල සීමාවක් ඇතුළත දී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා හා පාලන ඉරගුලාසි පිළිබඳ ප්‍රශ්න පත්‍රයක්ද මුදල් රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් ද අධ්‍යාපන නීතිය පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් ද යන ප්‍රශ්න පත්‍ර 3 කින් යුත් රජයේ ව්‍යවස්ථා හා රෙගුලාසි පිළිබඳ විභාගයකින් සාමාර්ථය ලැබිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් වැටුප් වැඩිවීම විලම්බනය කිරීම එහි ප්‍රතිඵලය වන්නේය. මෙම විභාගයෙන් සාමාර්ථය ලැබීමට ඉඩ දී ඇති කාලසීමාවට වැඩි කාලයක් ගතවී සාමාර්ථය ලැබූවිට එසේ ගතවූ වැඩි කාල පරිච්ඡේදය පඩි වැඩිවීම විලම්බනය කළ කාල පරිච්ඡේදයක් ලෙස සලකනු ලැබේ. මෙම විභාගයේ ව්‍යවස්ථා යනාදිය පරිශිෂ්ඨයෙහි දක්වා ඇත.

(iii) නිලධාරිනියක තවදුරටත් සේවයේ රඳවා ගැනීම නුසුදුසුයයි වැටහී ගියහොත් ප්‍රවාසන/පරීක්ෂණ කාලය ඇතුළත කවර අවස්ථාවකදී හෝ එය අවසානයේදී හෝ ඇයගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ තිබේ.

(iv) තෝරා ගන්නා ලද අයදුම්කරුවන් ඔවුන්ට නියම කරනු ලැබෙන ලංකාවේ කවර ප්‍රදේශයක වුවද සේවය කළ යුතුය.

(v) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ඇ රජයේ සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම් ඇයගේ පත්වීම ස්ථිර කළ දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීනතා තත්ත්වයේ නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත්විය යුතුය. මෙම පරීක්ෂණයෙන් අසමත්වීම පඩි වැඩිවීම විලම්බනය කිරීමට හේතු වන්නේය.

4. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරුවලට නියමිත වැටුප් ක්‍රමය මෙසේය. රු. 3,420 වාර්ෂික වැටුපකින් පටන්ගෙන රු. 120 වාර්ෂික පඩි වැඩිවීම් 4 කින් ද, රු. 180 වාර්ෂික පඩි වැඩිවීම් 8 කින් ද, රු. 240 වාර්ෂික පඩි වැඩිවීම් 6කින් වාර්ෂික වැටුප රු. 4,080, රු. 4,800 හා රු. 5,580 යන ස්ථානයන්ට පෙරාතුව කාර්යක්ෂමතා කඩඉම් සහිතව වාර්ෂික වැටුප රු. 6,780 දක්වා නගිනු ලබන වැටුප උපාධිධරයන් සඳහා ද, රු. 2,580 ක වාර්ෂික වැටුපකින් පටන්ගෙන රු. 120 වාර්ෂික පඩි වැඩිවීම් 11 කින්ද, රු. 180 වාර්ෂික පඩිවැඩිවීම් 5 කින් ද, වාර්ෂික වැටුප රු. 3,300, රු. 4,080 යන ස්ථානයන්ට පෙරාතුව කාර්යක්ෂමතා කඩඉම් සහිතව වාර්ෂික වැටුප රු. 4,800 දක්වා නගිනු ලබන වැටුප උපාධිධාරී නොවන්නන් සඳහා ද වේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(අ) 1969.9.10 වැනි දිනට වයස අවුරුදු 23 ට නො අඩු සහ අවුරුදු 40 ට නොවැඩි විය යුතු ය. (මෙම වයස් සීමාව දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින්නන් සඳහා අදල නොවේ.)

(ආ) උපාධිධාරීන් සඳහා :

(i) ගෘහ විද්‍යාව ඉගැන්වීම පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 3 කට නොඅඩු පලපුරුද්දක් සමග ගෘහ විද්‍යාව පිළිබඳ පුහුණු උපාධියක් තිබීම ; හෝ

(ii) ගෘහ විද්‍යාව ඉගැන්වීම පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 5 කට නොඅඩු පළපුරුද්දක් සමග ගෘහ විද්‍යාව පිළිබඳ උපාධියක් තිබීම.

(ඇ) උපාධිධාරී නොවන්නන් සඳහා :

(i) ගෘහ විද්‍යාව ඉගැන්වීම පිළිබඳ අවුරුදු 10කට නො අඩු පළපුරුද්දක් ඇති පුහුණු පළමුවන පෙළ ගුරුවරයෙකු වීම ; හෝ

(ii) ගෘහවිද්‍යාව ඉගැන්වීම පිළිබඳ අවුරුදු 15 කට නොඅඩු පළපුරුද්දක් ඇති පළමුවන පෙළ ගුරු සහතික පත්‍රය දරන ගුරුවරයෙකු වීම ; හෝ

(iii) ගෘහ විද්‍යාව ඉගැන්වීම පිළිබඳ අවුරුදු 10 කට නොඅඩු පලපුරුද්දක් සහ ගෘහ විද්‍යාව පිළිබඳ පිළිගත් ආයතනයක අවුරුදු 2කට නොඅඩු පාඨමාලාවක් හැදෑරීමෙන් පසු පිරිනමන ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ ඊට උසස් විභාගයකදී හෝ සිංහල භාෂාවෙන් හෝ සාහිත්‍යයෙන් සාමාර්ථයක් (සිංහල මාධ්‍යයේ නිලධාරිනීන් සඳහා) හෝ දෙමළ භාෂාවෙන් හෝ සාහිත්‍යයෙන් සාමාර්ථයක් (දෙමළ මාධ්‍යයේ නිලධාරිනීන් සඳහා) ලබා තිබිය යුතුය.

(ඉ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් සිටිය යුතුය.

6. ඉල්ලුම්කරුවන් විසින් මෙහි පහත දක්වෙන ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ.) ස්වකීය ඉල්ලුම් පත්‍රවලට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සංලක්ෂ්‍යය.—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතික භාරගනු නොලැබේ).

(ආ) ශාස්ත්‍රීය සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ලබා තිබෙන උසස්ම සහතික පත්‍ර.

(ඇ) ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම්, කල්ක්‍රියාව හා තනතුරට පත්කරනු ලැබීමට යොග්‍යතාව පිළිබඳ මෑතදී ලබාගත් සහතික තුනක් (සංලක්ෂ්‍යය.—දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් විසින් මේ අනුඡේදය යටතේ සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

7. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ පළකර තිබෙන රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි වලට සැලකිල්ල යොමු කරනු ලැබේ.

8. මුද්‍රිත අයදුම් පත්‍ර සපයනු නොලැබේ. ආකෘති පත්‍ර පහත පෙනෙන ආදර්ශ ආකෘති පත්‍රයෙන් පිටපත් කරගත යුතුය.

9. දැනට රජයේ සේවයේ යෙදී සිටින නිලධාරින්ගේ අයදුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනයෙන් පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් භාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තු ප්‍රධානින් වෙත ලැබී තිබුණ හොත් හා අයදුම්පත් පමාවීමට සෑහෙන හේතූන් දක්වමින් එම අයදුම්පත් භාරගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිර්දේශ කළහොත් පමණකි.

10. සියළුම අයදුම් පත්‍ර ලැබුණ බව දන්වා එවනු ලැබේ. අයදුම් පත්‍ර භාර ගැනීම අවසන් කොට සති 3 ක් ඇතුළත එසේ දන්වා එවනු නොලැබූ අයදුම්කරුවන් විසින් ඒ බව මෙම අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලන ශාඛාවේ ස්ථිර ලේකම් නැතට වහාම දන්වා එවිය යුතුය. මෙම නියමය නොපිළිපැදීම අයදුම්කරුවෙකු ගැන සලකා බැලීම සඳහා ඇති අයිතිවාසිකම් නැතිවීමට හේතු වනවා ඇත.

ස්ථිර ලේකම්,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය.

සාප/22/145.
1969.8.15 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

## ආදර්ශ ආකෘති පත්‍රය

**මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි (ගෘහ විද්‍යාව) තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

2. ලිපිනය :————.

3. 1969 සැප්තැම්බර් මස 10 වැනි දිනට නිවැරදි වයස :—
අවු :———— මාස :———— දින :————.

4. ජාතිකත්වය හා එය ලද අන්දම :————.

5. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරු :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.

(ඇ) පියාගේ පියා :————.

(ඈ) පියාගේ පියාගේ පියා :————.

6. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන වූ හෝ උසස් පරීක්ෂණයකින් ඔබ සමත් වී සිටින්නේ ද ? (එසේ නම් එය සමත්වූ මාධ්‍යයත්, සහතික පත්‍රයේ නමත් සඳහන් කරන්න. එහි පිටපතක් ඇමිණිය යුතුය.) :————.

7. ගෘහ විද්‍යාව පිළිබඳ ලබා ඇති සුදුසුකම් (සහතික පත්‍රවල පිටපතක් ඇමිණිය යුතුය.) :————.

8. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂා පිළිබඳ දැනුම :————.

9. ඉගෙනීම ලැබූ පාසැල් හා විද්‍යාල :————.

10. දැනට යෙදී සිටින රක්ෂාව, විස්තර සහිතව (ගුරුවරයෙකු නම් ලියාපදිංචි කළ අංකය, පාඨශාලාවේ නම, දැනට ලබන වාර්ෂික වැටුප, වැටුප් ක්‍රමය හා මීළඟ වැටුප් වැඩිවීමේ දිනය.) :————

11. ගෘහ විද්‍යාව ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දක්වෙන පෝර්ම යෙහි විස්තර සඳහන් කරන්න.) :————.

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | දරූ තනතුරු | ඇතුලත්වූ දිනය | අස්වූ දිනය | සේවාකාලය අවු. | මා. | දි. | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

12. චරිත සහතික ලබාගත් අයගේ ( ඥාතීන් නොවේ) නම් හා නිලතල සහිත සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ.) ඇමිණිය යුතුය. (රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය)

13. වෙනත් විස්තර :————.

මෙම අයදුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ අයදුම් පත්‍රයේ යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තේරීමට කලින් අනාවරණය වුවහොත් මා මෙම තනතුරට පත්වීමට නුසුදුස්සකු බවට පමණක් නොව තේරීමෙන් පසුව ඒ බව දැනගන්නට ලැබුණහොත්, කිසිම වන්දි ගෙවීමක් රහිතව, මා රාජකාරියෙන් පහකර දැමීමට යටත්වන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8–1126-—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### පහළ ශ්‍රෙණියේ අනියම් ඉංග්‍රීසි ලඝු ලේඛක තනතුර

පහළ ශ්‍රේණියේ අනියම් ඉංග්‍රීසි ලඝු ලේඛක තනතුර සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම් පත් ලාංකිකයන්ගෙන් 1969.9.5 වැනි දින පස්වරු 4.30 තෙක් භාරගනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—මෙම තනතුර හුදෙක් අනියම් වන අතර සේවය අනවශ්‍ය වූ වහාම අස්කරනු ඇත.

3. **වේතන.**—මෙම තනතුරට හිමි වේතනය දිනකට රු. 3.50 කි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—

(i) ජ්‍යෙෂ්ඨ හෝ ඊට වඩා උසස් විභාගයකින් ; හෝ

(ii) අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය පෙළ) වන අවස්ථාවක, අපේක්ෂකයකු විසින් (1) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව සහ (2) අංක ගණිතය හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ වාණිජ අංක ගණිතයත් ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. එතකුදු වුවත්, යටත් පිරිසෙයින් ඉන් විෂයයන් පහකින් වත් එකම විභාග අවස්ථාවකදී සාමාර්ථය ලබා තිබිය යුතුයි.

(iii) අපේක්ෂකයන් විසින් සිය අයදුම් පත්වල මෙහි පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුයි (මුල් පිටපත් නොවේ.) :—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) උසස්ම අධ්‍යයන සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඇ) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් ;

(ඈ) ලඝුලේඛනය හා යතුරු ලිවීම ගැන පළපුරුදු සහ සුදුසුකම් සඳහා සහතිකය.

5. **වේගය.**—ලඝු ලේඛනය—විනාඩියකට වචන 80 යි, යතුරු ලිවීම—විනාඩියකට වචන 30 යි.

6. **පළපුරුද්ද.**—අඩු වශයෙන් අවුරුදු 5 ක වත් ලඝු ලේඛනය ගැන පළපුරුද්දක් ඇති අයෙක් නම් යෙහෙකි.

7. **අනිකුත් කොන්දේසි.**—තෝරාගන්නා ලද අපේක්ෂකයාට හුදෙක් අනියම් පදනම් මත බන්ධනාගාර මූලස්ථානයේ වැඩ කිරීමට සිදු වේ. මෙයින් රජයේ ස්ථිර හෝ තාවකාලික රක්ෂාවකට මොනම අන්දමකින් වත් හිමිකමක් හෝ යම් ආයතනයක ස්ථිර හෝ තාවකාලික පත්වීමකට විශේෂ හිමිකමක් ඇති නොවේ. තවද, භාණ්ඩාගාරයේ අංක 682 හා 685 දරණ චක්‍රලේඛනවල සඳහන් විධිවිධාන මෙම අපේක්ෂකයන් කෙරෙහි බල නොපානු ඇත. රජයේ සාමාන්‍ය නීතිරීති හොඳින් පිළිපැදිය යුතුව ඇත.

8. **අයදුම්පත්.**—පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුරූප වන සේ පිළියෙල කළ අයදුම් පත් මගින් ඉල්ලුම් කළ යුතුය. එය කොළඹ 9, බන්ධනාගාර කොමසාරිස් වෙත ලිපිනය කළ යුතුය.

එෆ්. එල්. ඩී. රත්නායක,
බන්ධනාගාර කොමසාරිස්.

### පහළ ශ්‍රේණියේ අනියම් ලඝු ලේඛක තනතුරු වලට ඉල්ලීම් සඳහා අවශ්‍ය පෝර්මය

1. නම :————.

(අ) වාසගම :————.

(ආ) නම :————.

2. ස්ථිර ලිපිනය :————.

3. උපන් දිනය හා 1969.9.5 දිනට වයස :————.

4. පියාගේ නම සහ රක්ෂාව :————.

5. උපන් ස්ථානය :—

(අ) ඉල්ලුම්කරුගේ පියා :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.

6. (අ) ජාතිය :————.

(ආ) යුෂ්මතා ලාංකිකයෙක් ද ? :————.

(i) උත්පත්තියෙන් ද ? :————.

(ii) නැතහොත් ලියාපදිංචි කරවා ගැනීමෙන් ද ? :————.

7. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඇ) ඉංග්‍රීසි :————.

8. ලඝු ලේඛනය හා යතුරු ලිවීමේ පළපුරුද්ද සහ දැනීම :————.

9. වෙනත් සුදුසුකම් :————.

10. චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කරන්නා වූ තිදෙනාගේ නම් :————.

මෙම අයදුම් පත්‍රයෙහි මවිසින් ප්‍රකාශ කරන ලද කරුණු නිවැරදි හා සත්‍ය ඒවා බවට සහතික කරමි. මෙහි ඇති කරුණු වැරදි හෝ අසත්‍ය බව තෝරා ගන්නට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වෙනවා පමණක් නොව, පත්වීමෙන් පසුව අනාවරණය වුවහොත් කිසිම වන්දි මුදලක් නොමැතිව සේවයෙන් පහ කිරීමට හේතු වන බවද, මම හොඳ හැටි දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8–1012—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

## ලංකා බැංකුව

### කණිෂ්ඨ ලිපිකරු හා සහායක කැෂියර් තනතුරු

බැංකු සේවයේ කණිෂ්ඨ ලිපිකරු හා සහායක කැෂියර් තනතුරු සඳහා පිරිමි අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම් පත් භාරගනු ලැබේ. කොළඹ 1, ලංකා බැංකුවේ, මධ්‍යම කාර්යාලයේ, මාණ්ඩලික අංශයේ, කළමනාකරුගෙන් තැපැල් මගින් පමණක් ලබා ගත හැකි මුද්‍රිත පෝරමවල ඉදිරිපත් කළයුතු අයදුම් පත් 1969 සැප්තැම්බර් 17 දින හෝ ඊට පෙර ඔහුට ලැබෙන සේ එවිය යුතු ය.

ඉල්ලුම් පත් පෝරම සඳහා ඉල්ලීම් සමග තම ලිපිනය සඳහන්, මුද්දර ගැසූ 9" × 4" ප්‍රමාණයට කුඩා නොවන ලියුම් කවරයක් බහා එවිය යුතු ය.

මෙහි පැමිණ ඉල්ලුම් කරන අයට ඉල්ලුම් පත් ලබා ගත නොහැක.

(1) වැටුප් හා දීමනා :

(ආ) වැටුප් හිණ : $\dfrac{\text{රු. 118 සිට රු. 310}}{16 \times 6,\ 4 \times 7,\ 1 \times 8 \text{ සහ } 6 \times 10}$

(ඇ) ලංකා බැංකුව මගින් සම්මත ජීවනාධාර.

(2) සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකුම—

(ආ) තමන් ලාංකිකයෙකු බවටත්,

(ඇ) 1969 සැප්තැම්බර් 17 දිනට තමන්ගේ වයස අවුරුදු 18ට නො අඩු එහෙත් 22ට නො වැඩි බවටත්,

පිළිගත හැකි සාධක ඉදිරිපත් කළ යුතු ය.

(3) අධ්‍යාපනික සුදුසුකම් :

අංක ගණිතය හෝ වාණිජ ගණිතය හෝ ගණිතය (ශුද්ධ, මූලික, ව්‍යවහාරික හෝ උසස්) සහ සිංහල හෝ දෙමළ යන විෂයයන් ඇතුලුව විෂයයන් හතරකට සම්මාන සාමර්ථ ඇතිව එකම වරකදී විෂයයන් හයක සාමර්ථය සහිතව අධ්‍යයන පොදු සහතිකපත් (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව සිටිය යුතු ය.

**(4) ඉල්ලුම්කරුවන් ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් ලේඛනවල පිටපත් ඇමිනිය යුතු යි. (මුල් ලේඛන නොවේ.)—**

(ආ) උප්පැන්න සහතිකය.

සැළකිය යුතුයි :

(i) පාසැල් සඳහා ද අධ්‍යාපනික කටයුතු සඳහා ද නිකුත් කෙරෙන විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියා පදිංචි කිරීමේ ලේඛනයෙන් උපුටාගත් සහතික කළ උධෘත හෝ භාර ගනු නො ලැබේ.

(ii) උප්පැන්න සහතික වෙනුවට දිවුරුම් පත්‍ර හෝ බෞතීස්ම සහතික භාර ගනු නො ලැබේ.

(iii) ඔබ විසින් භාවිතා කරනු ලබන නම/නම්, උප්පැන්න සහතිකයේ දක්වෙන නම/නම් හා නො සැසඳේ නම් උප්පැන්න සහතිකයේ නම උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ (110 ඡේදය) උචිත අන්දමින් 27 හෝ 28 කැඩිය යටතේ නිසිසේ සංශෝධනය කොට තිබිය යුතු ය.

(ඇ) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික පත්.

සැළකිය යුතුයි :

(i) විභාග කොමසාරිස් විසින් සහතික පත්‍ර නිකුත් කොට ඇත්නම් ඒවායේ පිටපත් අමුණා එවිය යුතු යි.

(ii) විභාග කොමසාරිස් විසින් සහතික පත් නිකුත් කොට නොමැති නම් සමත් වූ විභාග පිළිබඳව විභාග අංක හා දිනයන් ද සමත් වූ විෂයයන් හා එක් එක් විෂයය වෙනුවෙන් ලබා ගත් ශ්‍රෙණිය ආදී විස්තර ද සහිතව විද්‍යාලයාධිපතීන් විසින් නිකුත් කළ සහතිකවල පිටපත් එවිය යුතු යි.

(ඊ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය හා යෝග්‍යතාවය පිළිබඳ මෑතදී ලබා ගත් සහතික තුනක්.

(5) සේවා කොන්දේසි :

තෝරාගත් අයදුම්කරුවන් :

(ආ) පත්වීම ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

(ඇ) අවුරුද්දකට නො අඩු අවුරුදු 3කට නො වැඩි ආධුනික සේවා සමයක සේවය කළ යුතු අතර මේ වකවානුව තුළදී රාජ්‍ය භාෂා ප්‍රවීනතා විභාගයේ 3 වන ශ්‍රෙණියෙන් සමත් කම් ලබා ගත යුතු ය. එතකුදු වුවත් අති විශේෂ අවස්ථාවලදී තම අභිමතය පරිදි ආධුනික සේවා සමය අවුරුද්දකින් දීර්ඝ කිරීමට බැංකුවේ පාලකයින්ට ඉඩ ඇත.

(ඊ) සේවය පිළිබඳව විශිෂ්ඨ වාර්තාවක් පිහිටුවනු ලැබුවහොත්, පත්වීම ලැබ් අවුරුද්දක් සම්පූර්ණ වන දිනය හා රාජ්‍ය භාෂාව පිළිබඳ 1 වෙනි ශ්‍රෙණියේ විභාගයෙන් සාමර්ථය ලබන දිනය යන මේ දෙකෙන් පසුවට එළඹෙන දිනයේ දී පමණක් 1 වන වැටුප් වැඩිවීම ලබන්නට ඔහු සුදුස්සෙකු වේ.

(උ) සේවය පිළිබඳව විශිෂ්ඨ වාර්තාවක් පිහිටුවනු ලැබුවහොත්, පත්වීම ලැබ් අවුරුදු දෙකක් සම්පූර්ණ වන දිනය හා රාජ්‍ය භාෂාව පිළිබඳ දෙවැනි ශ්‍රෙණියේ විභාගයෙන් සාමර්ථය ලබන දිනය යන මේ දෙකෙන් පසුවට එළඹෙන දිනයේ දී පමණක් දෙවන වැටුප් වැඩිවීම ලබන්නට ඔහු සුදුස්සෙකු වේ.

(ඒ) ඔවුන්ගේ තනතුරුවල ඔවුන් ස්ථිර කරනු ලබන්නේ ඉහත සඳහන් 5(ඇ) දරන වගන්තියේ කොන්දේසි සපුරාලන දිනයේ සිට පමණය.

(ඔ) 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධි විධානයන්ට මෙන්ම රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාරියෙහිලා දැනට බලපැවැත්වෙන හෝ අනාගතයේ දී ඉදිරිපත් කරන්නට ඉඩ ඇති හෝ කිසියම් නීති හෝ ව්‍යවස්ථාවන් අනුගමනය කිරීමේ කොන්දේසියකට ඔවුන් එකඟ විය යුතු ය.

(කා) පිරිමි සේවකයන්ට බලපැවැත්වෙන බැංකුවේ විශ්‍රාම නඩත්තු ක්‍රමයට ඔවුන් ඇතුළත් විය යුතු ය.

(6) සුරැකුම් (සහායක කැෂියර්වරුන්ට පමණි) :

තෝරාගත් අයදුම් කරුවන් ඔවුන්ගේ රාජකාරි කටයුතු නියමිත අන්දමින් හා විශ්වාසවන්ත ලෙස ඉටු කිරීම සඳහා රු. 2,500 ක සුරැකුම් ඉදිරිපත් කළ යුතු ය. මින් අඩුම වශයෙන් රු. 500 ක් මුදලින් ද ශේෂය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් නිකුත් කෙරෙන ඇප ඔප්පුවකින් ද විය යුතු ය.

(7) සාමාන්‍යයි :

(ආ) අයදුම්කරුවන් කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් සඳහා පැමිණිය යුතුයි. මග වියදම් හෝ වෙන කිසියම් මුදලක් මේ සඳහා ගෙවනු නො ලැබේ.

(ඇ) තම අයදුම් පත් ලියා පදිංචි තැපැලෙන් එවන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. අයදුම් පත් ලැබුණු බව දැන ගැනීමට කැමති අයදුම්කරුවන් තමන්ගේ ලිපිනය සඳහන් කොට මුද්දර ගැසූ ලියුම් කවරයක් අයදුම් පත සමග එවිය යුතු යි.

(ඊ) අයදුම් පත බහා එවන කවරයේ ඉහල වම් කෙළවරේ අයදුම් කරන තනතුර අනුව "කණිෂ්ඨ ලිපිකරු තනතුර සඳහා අයදුම් පත" සහ/හෝ "සහායක කැෂියර් තනතුර සඳහා අයදුම් පත" යනුවෙන් පැහැදිලිව ලකුණු කළ යුතු යි.

(උ) අයදුම් පතක් හෝ අයදුම් පතක් පිළිබඳ ලිපියක් හෝ තැපැලේ දී නැතිවීම හෝ පමාවීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නො ලැබේ. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය ආසන්න වනතෙක් තම ඉල්ලුම් පත් එවීම ප්‍රමාද කරන අයදුම්කරුවෝම ඒ හේතුවෙන් පැන නගින්නා වූ අවදානමකට වගකිව යුත්තෝ වෙති.

(ඒ) අවශ්‍ය සුදුසුකම් නොමැති අය ඉල්ලුම් පත් නො එවත්වා.

**සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන්නේ තනතුරු සඳහා ඉහළම සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණකි. කිසියම් අයදුම්කරුවෙකු ගැන නිර්දේශ කරන්නට කැමති කෙනෙකු වෙතොත් එසේ කළ යුත්තේ සහතිකයක් දීමෙනි. අයදුම්කරුවෙකු තෝරා පත් කිරීම සම්බන්ධයෙන් මොනම අන්දමකවත් පෙළැඹවීමක් හෝ බලපෑමක් හෝ කරන්නට උත්සාහ කළහොත් ඒ හේතුවෙන්ම එම අයදුම්කරු නුසුදුස්සෙකු බවට පත් වන්නේය.**

ඩී. ඊ. පෙරේරා,
කළමනාකරු, මාණ්ඩලික අංශය.

8–1048—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

## ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය

### සාමාන්‍යාධිකාරී තනතුර

යථෝක්ත තනතුර සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**වැටුප් පරිමාණය :**

රු. 1,800—50—රු. 2,000 සියළු දීමනා සහිත මාසික වේතනය.

**අධ්‍යාපන සුදුසුකම් :**

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහ විධායක තත්ත්වයේ අවුරුදු 15 ක පළපුරුද්ද; හෝ

(ආ) ඉංජිනේරු විද්‍යාව පිළිබඳ සම්පූර්ණ වෘත්තීය සුදුසුකම් සහ වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසු අවුරුදු 8 ක පළපුරුද්ද; හෝ

(ඇ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ඒ.සී.ඒ.) හෝ පිරිවැය ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ඒ.සී. සහ ඩබ්ලිව්.ඒ.) සාමාජිකත්වය සහ වෘත්තීය සුදුසුකම් ලැබීමෙන් පසු අවුරුදු 8 ක පළපුරුද්ද තිබිය යුතුය.

**සේවා කොන්දේසි :**

(i) මෙය ස්ථිර තනතුරක් වන අතර, තෝරා ගනු ලබන අයදුම්කරුට මණ්ඩලීය අණ පනත් යටතේ අර්ථසාධක අරමුදලේ වරප්‍රසාද ලැබෙනු ඇත.

(ii) පත්වීම මුල් වතාවට අවුරුදු 3 ක ප්‍රවාසන කාලයකට යටත් වේ.

(iii) රජයේ භාෂා ප්‍රතිපත්තියට යටත් විය යුතු වේ.

(iv) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් පුල්මුඩේ හෝ වීන වරායේ අප කාර්යාලයන්හි සේවය කළ යුතු අතර, දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමටද සූදානම්ව සිටිය යුතුයි.

දනට රජයේ හෝ රජයේ සංයුක්ත මණ්ඩලයක හෝ සේවයේ නියුතු නිළධාරීන්ගේ අයදුම් පත් සිය ප්‍රධානීන් මගින් එවිය යුතු අතර, එම ඉල්ලුම් පත් සලකා බලනු ලබනුයේ 65.8.20 දින අංක 666 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ අවශ්‍යතාවයනට යටත්වය.

නියමිත ආකෘති පත්‍ර නොමැත. අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද, වයස, සිංහල භාෂා ප්‍රවීණතාව ඇතුළු වෙනත් අවශ්‍ය තොරතුරු සඳහන් ඉල්ලුම් පත්‍ර උප්පැන්න සහතිකයේත්, පළපුරුද්ද පිළිබඳ සහතික වලත්, ළඟදී ලබාගත් චරිත සහතික දෙකකත් පිටපත් ද අමුණා 1969 සැප්තැම්බර් 20 වැනිදට හෝ ඊට පෙර, කොළඹ 7, 22/2, තර්ස්ටන් පාරේ ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි. නැතිනම් කාර්යාලයට පැමිණ භාර දිය යුතුයි.

සෝ. ඉගලහේවා,
ලේකම්/සේවක නිලධාරි,
ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය.

22/2, තර්ස්ටන් පාර,
කොළඹ 7,
1969 අගෝස්තු මස 11 වෙනි දින.

8–1002—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ආධුනික සැලසුම්කරු තනතුරු (තාවකාලික)

ඉහත සඳහන් විෂය යටතේ 1969.7.18 දින අංක 14,863 දරණ රජයේ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනය සම්බන්ධවයි. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය 1969.9.1 දින ලෙස වෙනස්කළ බව මෙයින් දන්වනු ලැබේ.

එල්. බී. මාරඹේ,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන).

1969 අගෝස්තු මස 11 දින,
පේරාදෙනියේ
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

8–993—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ආරෝග්‍යශාලා ලේකම්වරුන් සඳහා 1969 ඔක්තෝබර් මස පැවැත්වෙන අර්ධ වාර්ෂික විභාගය

1969 ඔක්තෝබර් මස 23 සහ 24 දිනයන්හි මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ආරෝග්‍යශාලා ලේකම්වරුන් සඳහා අර්ධ වාර්ෂික විභාගය පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරමි.

1969 ඔක්තෝබර් 24 {
රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි සහ පාලන නීති සංග්‍රහය
ආරෝග්‍යශාලා සහ බෙහෙත් හල් පරිපාලනය ගණන් පත්‍රය

2. සිංහල/දෙමළ වාචික පරීක්ෂණය 1969 ඔක්තෝබර් මස 23 වෙනි දින පවත්වනු ලැබේ.

3. මෙම විභාගයට ඇතුලත් වීම සඳහා ඉල්ලුම් පත් විමධ්‍යගත කොට්ඨාශ භාර ප්‍රධානීන්ගෙන් ලබාගත හැකි ආකෘති ප්‍රකාර විය යුතුයි.

4. මෙම විභාගය පවත්වනු ලබන්නේ විභාග කොමසාරිස් විසින්ය. ඔහු විසින් මෙම විභාගය පවත්වනු සඳහා පනවනු ලබන නීති රීති සම්බන්ධයෙන් ආධුනිකයින් යටත් විය යුතුයි.

5. ඉල්ලුම් පත් තම විමධ්‍යගත කොට්ඨාශ භාර ප්‍රධානීන් මගින්, කොළඹ, මැලේ වීදියේ විභාග කොමසාරිස් තුමා වෙත 1969.9.22 දිනට මත්තෙන් යැවිය යුතුය. විමධ්‍යගත කොට්ඨාශ භාර ප්‍රධානීන් විසින් එම ඉල්ලුම් පත් 1969.9.22 වන දිනට ප්‍රථමයෙන් විභාග කොමසාරිස් තුමා වෙත ලැබීමට සලස්වනු පිණිස, 1969.9.17 වන දිනට ප්‍රථමයෙන් සෑම ආධුනිකයෙකු විසින්ම ඔවුන්ගේ ඉල්ලුම් පත් අදාල විමධ්‍යගත කොට්ඨාශ භාර ප්‍රධානීන් වෙත යැවිය යුතු බව දත ගත යුතුය.

6. 1969.9.17 වෙනි දිනට පසු ලැබෙන සෑම ඉල්ලුම් පතක් ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වී. පී. ඒ. පෙරේරා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන),
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1969 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

8–1029—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1969–70 මුදල් වර්ෂය තුළ දර සැපයීම

1969 ඔක්තෝබර් මස 1 වෙනිදා සිට 1970 සැප්තැම්බර් මස 30 වෙනිද දක්වා බන්ධනාගාරවලට කැලෑ අණ සපයා භාරදීම පිළිබඳව එම ආයතනයේ අධිකාරී විසින් 1969 සැප්තැම්බර් 14 වෙනි දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

විස්තර මෙසේය :

සැපයීම පිළිබඳ විස්තර පහත සඳහන් අයුරු :—

විශ්කම්භය අඟල් 3 කට නො අඩුවූද, අඟල් 12 ට නොවැඩිවූද, දිග අඟල් 18 කට නො අඩුවූද, අඟල් 36 කට නො වැඩිවූද, ඉතා හොඳට වියලුනු තද, මේරූ ගැටවලින් තොරවූද, දර කැබලි එවෙලේම ප්‍රයෝජනයට ගැනීමට තරම් සුදුසු තත්ත්වයකට ඇති ඒවා විය යුතුයි. සපයනු ලබන දර ගොඩපර, දියපර, කටුකැරැල්ල, මී, මිල්ල, හොර, සියඹලා, දවට, පලු, මිහිරිය, දන්, මොර, කුඹුක්, මූනමල්, මාදන්, අලුබෝ ආදී තද ලී වර්ග වලට ඇතුළත් විය යුතුයි. හොණ්ඩරයකට රු. 14 සිට 28 දක්වා වූ ප්‍රමාණයකින් වියලීමට හා පොකුවලට අඩු කරනු ලැබේ.

එමෙන් ම කැන්ද, ඇටඹ, රුක්අත්තන, ගැවලීයා, සපු, අඹ, ඇල්බීසියා, මාර, කැකුණ, ඊරිය, හික්, මලබොඩ ආදී බුරුල් ලී වර්ගවලට අයත් දර භාරගනු නො ලැබේ. කැලෑ දර සහ රබර් දර හොණ්ඩරයක මිළ වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතුය.

2. බන්ධනාගාරවල හෝ කිට්ටු කච්චේරියක රු. 10 ක් තැන්පත් කිරීමෙන් ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අධිකාරීන් ගෙන්, 1969 සැප්තැම්බර් මස 13 වෙනිදා පස්වරු 3 දක්වා දර සැපයීම සඳහා

ආකෘති පත්‍ර ලබාගත හැක. එම ආකෘති පත් සමග අනුපිටපතක් ද එවිය යුතුයි. පහත සඳහන් ආයතනයන් සඳහා ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී ටෙන්ඩර් තැන්පත් මුදල් ඇවැසි නොවේ :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ;

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

3. ටෙන්ඩර් පත්‍ර සීල් කරන ලද කවරයක බහා එහි වම් කෙළවරෙහි " දර සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර " යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවනු නොලැබේ නම්, ටෙන්ඩර්කරු විසින් හෝ ඔහුගේ නියෝජිතයා විසින් බන්ධනාගාර ගේට්ටුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් විවෘත කරන දින නියමිත වේලාවට පෙර බහාලිය යුතුයි.

4. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිළ ගණන් අකුරෙන් හා ඉලක්කමින් ද විය යුතුයි. එසේ නොමැති ටෙන්ඩර ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට දන්වා යවා දින 10 ක් ඇතුළතදී රු. 350 මුදලින් ඇපයක් තබා බන්ධනාගාර අධිකාරි තැන සමග ඒ පිළිබඳ ගිවිසුමකට නොබැඳුනහොත් ඔහු විසින් තැන්පත් කළ ටෙන්ඩර් මුදල රාජසන්තක වීමට ද ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත් කඩ කරන්නන්ගේ නාම ලේඛන යට ඇතුළත් වීමට ද ඉඩ ඇත.

6. හැම ටෙන්ඩරයක් ම 1968 සැප්තැම්බර් මස 8 වෙනි දින පෙරවරු 9.35 ට විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

7. ටෙන්ඩර් භාරගත් අවසාන දින සිට මාස තුනක් යනතුරු ටෙන්ඩර් කරුවන් විසින් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුය.

ඇෆ්. ඩී. ඇල්. රත්නායක,
බන්ධනාගාර කොමසාරිස්.

1969 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ 9.

බන්ධනාගාර වලට අවශ්‍ය ප්‍රමාණය දළ වශයෙන් පහත දැක්වෙන අයුරුය :—

1. මහනුවර ... ... ටොන් 250
2. මීගමුව ... ... ටොන් 100
3. වතුපිටිවෙල ... ... ටොන් 140
4. යාපනය ... ... ටොන් 75
5. අනුරාධපුරය ... ... ටොන් 290
6. පල්ලෙකැලේ එළිමහන් සිර කඳවුර ... ටොන් 250

8–1128—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

### පාවිච්චියට අයෝග්‍ය භාණ්ඩ මිළ දී ගෙන ඉවත් කරගෙන යාම

පාවිච්චියට අයෝග්‍ය හා අනවශ්‍යයි සැලකෙන ගෘහ භාණ්ඩ (පුටු මේස ආදිය) තොගයක් ද, බයිසිකල්, යතුරු ලියනයන්, කාර් බැටරි, කාර් සහ ලොරි ටයර් ආදිය ඇතුලත් විවිධ භාණ්ඩ තොගයක් ද මිළ දී ගෙන ඉවත් කරගෙන යාම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1969 සැප්තැම්බර් 15 වන දින පෙරවරු 10 වන තෙක් කොළඹ 1, ලෝටස් පාරේ පිහිටි සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැන විසින් භාරගනු ලැබේ.

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල දෙපිටපතකින් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළයුතු වන අතර ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරවල වම් කෙලවරේ " පාවිච්චියට අයෝග්‍ය හා අනවශ්‍ය යයි සැලකෙන භාණ්ඩ මිල දී ගෙන ඉවත් කරගෙන යාම සඳහා ටෙන්ඩර් පත්‍ර " යනුවෙන් සඳහන් කළ යුතු ය.

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ රු. 25 ක් තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1969 සැප්තැම්බර් මස 12 දින සවස 3 වනතෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැක.

ටෙන්ඩර්කරුවන්ට එක් භාණ්ඩයකට හෝ භාණ්ඩ කිහිපයකට හෝ මුළු තොගයටම හෝ මිළ ගණන් ඉදිරිපත් කළ හැක.

1969 සැප්තැම්බර් 15 දින පෙරවරු 10.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන කල්හි ටෙන්ඩර්කරුවනට පැමිණ සිටිය හැක.

ඩබ්. එල්. පී. ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 14 වැනි දින,
ලෝටස් පාර,
කොළඹ 1.

8–1100—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

1969 ඔක්තෝබර් 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් 30 වැනි දින දක්වා කාලය තුලදී අම්බලන්ගොඩ, මාදම්පේ කාර්මික බඩු ගබඩාවේ සිට, 10,00,000 ක් පමණ ලුණු මළු, අම්බලන්ගොඩ දුම්රිය ස්ථානයට පටවා ගෙන ගොස් භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969.9.5 වැනි දින පෙ.ව. 10.30 දක්වා මවිසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර සහ වෙනත් විස්තර, කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ පිහිටි ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් හෝ ගාල්ල කච්චේරියේ සිටින ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ තැනගෙන් හෝ අම්බලන්ගොඩ මාදම්පේ කාර්මික බඩු ගබඩාවෙන් හෝ ලබාගත හැකිය.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

මගේ අංකය : ඩීබී/ජී,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
කොළඹ 7,
1969 අගෝස්තු මස 15 දින.

8–1129—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—හසලක උප කොට්ඨාශය

හසලක උප කොටසේ පහත සඳහන් කාර්‍ය සඳහා ටෙන්ඩර් 1969 සැප්තැම්බර් මස 16 වෙනි අඟහරුවාදා පෙවරු 10 දක්වා මහනුවර මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කිරීම එවෙලෙහිම සිදු කෙරේ.

**කාර්‍ය විස්තරය**

1969–70 සහ 1970–71 වර්ෂවල බඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීම

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 25,0000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ අඩුවශයෙන් තමන්ගේ නමින් ලියා පදිංචි කොට ඇති ලොරි දෙකක්වත් හිමි කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1969 අගෝස්තු මස 19 වෙනි අඟහරුවාදා පෙ. ව. 9 සිට 1969 සැප්තැම්බර් මස 13 වෙනි සෙනසුරාදා පස්වරු 4.30 වනතෙක් හසලක, මහනුවර, මාතලේ හා නුවර එළිය උප කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරු වරුන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි පෝරමවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් හා දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයන් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම එම වැඩය සඳහා රු. 50 ක් ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩර් ගැන සියළු විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුලදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

ඩී. ඇස්. ඒ. කුලසේකර,
වාරිමාර්ග ඉංජිනේරු, හසලක උප කොටස.

1969 ජූලි මස 26 වෙනි දින,
හසලක, වාරිමාර්ග කාර්‍යාලයේදී ය.

8–1006—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—හම්බන්තොට උප කොටස

හම්බන්තොට උප කොටසේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1969 සැප්තැම්බර් මස 16 වැනිදා පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ :—

ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

| | වැඩ විස්තරය | ලියාපදිංචිය | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|
| (1) | මුරුතවෙල ව්‍යාපාරයේ වම් ඉවුරු ඇලෙහි දඹහිටි දෙල හරහා පීලි මාරුවක් තැනීම ... ... | රු. 75,000 | ... රු. 100 |
| (2) | මුරුතවෙල ව්‍යාපාරයෙහි ගෝනදෙනිය ආරෙහි දිය බස්නා මාවත තැනීම ... ... ... | රු. 85,000 | ... රු. 100 |
| (3) | මුරුතවෙල ව්‍යාපාරයෙහි දකුණු ඉවුරු ඇලෙහි සයිෆනයක් තැනීම ... ... ... | රු. 80,000 | ... රු. 100 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි ඉහතින් දක්වෙන ප්‍රමාණයන්ට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

3. 69.9.7 සිට 69.9.13 දක්වා පමණක් වැඩ කරන දිනවල කාර්යාල වේලාවන් තුලදී හම්බන්තොට උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු මහතාගේ කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝරම්වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ෆෝරම නිකුත් කිරීමට ප්‍රථම ඉහත දක්වෙන පිළිවෙලට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩරය ගැන සියලුම වැඩ විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැළසුම විශේෂ විස්තර යනාදිය කාර්යාල වේලාවන් තුලදී හම්බන්තොට උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

පී. සත්‍යවෙල්,
වාරිමාර්ග ඉංජිනේරු, හම්බන්තොට.

හම්බන්තොට
වාරිමාර්ග කාර්යාලයේදීය.
1969 අගෝස්තු මස 13 දින.

8–1027—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—අම්පාර උප කොටස

පහත දක්වෙන වැඩ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් අයදුම්පත් 1969 සැප්තැම්බර් මස 5 වෙනි සිකුරාද පෙරවරු 10 දක්වා මඩකළපුව නැගෙණහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එම වැඩ ඉදිරියේ දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන් වලට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

| ටෙන්ඩර් අංකය | වැඩයේ නම | ලියාපදිංචි වූ ගණන | තැන්පත් මුදල |
|---|---|---|---|
| | | රු. | රු. |
| ඒ/40/68–69 | අම්පාරේ උප කොටසේ ගංගා ප්‍රදේශයේ උඩංගා අමුණ ඉදි කිරීම ... | 50,000 ... | 100 |

1969 සැප්තැම්බර් මස 1 වෙනි සඳුද සවස 4 දක්වා අම්පාර කල්මුණ හා වෙන්කල්අඩි උප කොට්ඨාශයන්හි වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලයන්ගෙන් කාර්යාල වේලාවන් තුලදී ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කොට එවිය යුතුය. ටෙන්ඩර් ආකෘති පත් සඳහා ඉල්ලුම් කිරීමේදී, ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචිවීමේ පොත් සහ දනට ඔවුන් කරන දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම පිළිබඳව ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ තිබේද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති නිකුත් කිරීමට පෙර, වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ ඉහත සඳහන් ප්‍රකාර ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළයුතුව ඇති අතර, එසේ නැතහොත් දිසාපති කාර්යාලයක එවැනි තැන්පත් කිරීමක් කළ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. මෙම ටෙන්ඩර් පිළිබඳව වැඩි විස්තර අම්පාර උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් කාර්යාල වේලාවන් තුලදී ලබා ගත හැක.

පී. එම්. චන්ද්‍රදස,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
අම්පාර උප කොටස.

1969 අගෝස්තු මස 9 වෙනි දින,
උප කොට්ඨාශ වාරිමාර්ග කාර්යාලයේදීය.
අම්පාර.

8–1018—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

කොළඹ ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් මුද්‍රාතෝ වියුනිසියා ගබඩාවට පහත සඳහන් හොඳ පරන තිස් ගෝනි සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1969 සැප්තැම්බර් 12 වැනි සිකුරාදා ප. ව. 2.30 වනතෙක් භාරගනු ලැබේ.

බුසල් 2½ (දෙකහමාර) ගෝනි 50,000 ක් හාල් මැනීම සඳහා.

බුසල් 3½ (තුනහමාර) ගෝනි 50,000 ක් වී මැනීම සඳහා.

2. කොළඹ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60 හෝර්ටන් පෙදෙස කාර්යාලයේ ගණකාධිකාරී තැනට හෝ දිවයිනේ කච්චේරියකට රු. 200 ක තැන්පත් මුදලක් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නි.මී.යෝ.ක්‍රා. හා වී. කෙ. අංශයට ඉදිරිපත් කර, ටෙන්ඩර් පත් ලබාගෙන අනු පිටපතක්ද සහිතව පුරවා එවිය යුතුයි. 1969 සැප්තැම්බර් 12 වෙනි සිකුරාදා දවල් 12 වනතෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ වියුනිසියා ගබඩාවේ ගණකාධිකාරී තැනගෙන් විමසා දැනගත හැක.

වී. කී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ 7. තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දී.

8–1085—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### රජයේ ගොවිපලවලට වල් අඹ ඇට සැපයීම හා ගෙනවිත් භාරදීම සහ මුරුන්කන් ගොවිපලේ නියරවල් අළුත්වැඩියා කිරීම

කෘමීන්ගෙන් හානි නොවූ වල් අඹ ඇට සැපයීම හා ගෙනවිත් භාරදීම සහ නියරවල් අළුත්වැඩියා කිරීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් 1969.9.12 වෙනි දින පෙ.ව. 10 දක්වා යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගොවි පාලන හා නිෂ්පාදන) විසින් භාරගනු ලැබේ.

(අ) (1) යාපනයේ තින්නවේලි ගොවිකම් පාසැලට කෘමීන්ගෙන් හානි නොවූ වල් අඹ ඇට 30,000ක්—

වල් අඹ ඇට සතියකට 6,000 සිට 7,000 දක්වා ප්‍රමාණයක් සපයා ගොවිපලට ගෙනවිත් භාර දිය යුතුයි. වල් අඹ ඇට සැපයීම 1969 නොවැම්බර් මාසයේ පළමුවන සතියේදී පටන්ගෙන 1969 දෙසැම්බර් මස 31 වෙනි දිනට පෙර නිම කළ යුතුයි.

(2) මුරුන්කන් ගොවිපලට කෘමීන්ගෙන් හානි නොවූ වල් අඹ ඇට 15,000ක්—

වල් අඹ ඇට ගෙනවිත් භාරදීම කොටස් වශයෙන් කළ යුතු අතර එකවරට 2,000ක් සැපයිය යුතුයි. වල් අඹ ඇට සැපයීම 1969 නොවැම්බර් මාසයේ ආරම්භ කර 1969 දෙසැම්බර් මාසයේ 31 වෙනි දිනට පෙර නිම කළ යුතුයි.

(3) සමාන්තුරේ ගොවිපලට කෘමීන්ගෙන් හානි නොවූ වල් අඹ ඇට 20,000ක්—

වල් අඹ ඇට ගෙනවිත් භාරදීම කොටස් වශයෙන් කළ යුතු අතර එකවරකට 2,000ක් සැපයිය යුතුයි. වල් අඹ ඇට සැපයීම හා ගෙනවිත් භාරදීම 1969 නොවැම්බර් මාසයේ පටන් ගෙන 1969 නොවැම්බර් මාසයේ 25 වෙනි දිනට පෙර නිම කළ යුතුයි.

අඹ ඇටවලට පමණක් ගෙවනු ලැබේ. අඹ ඇට 100ක අය කරන මිළ ගණන් දක්විය යුතුයි.

(ආ) නියරවල් අළුත්වැඩියා කිරීම—

මුරුන්කන් ගොවිපලේ කළමනාකරු සෑහීමට පත්වන පරිදි දනට කුඹුරේ ඇති දම්වැල් 1,000ක් පමණ නියරවල් පැලැටි නෙලා හොඳ තත්ත්වයකට අළුත්වැඩියා කිරීම. අවසන් කළ නියරයක් අඩුම වශයෙන් අඩි 3ක් යටින් පළලද, උඩින් අඩි 1ක්ද, උසින් අඩි 2ක්ද විය යුතුයි. වැඩය ගොවිපලේ කළමනාකරු දන්වා දින තුනක් තුළදී ආරම්භ කර ඔහු සෑහීමට පත්වන පරිදි 1969 ඔක්තෝබර් මාසයේ 31 වෙනි දිනට පෙර අවසන් කළ යුතුයි. ගණන් දක්විය යුත්තේ දම්වැලකට අය කරන ප්‍රමාණය අනුවයි. වැඩියෙන් කාලය දීර්ඝ කරනු නොලැබේ.

2. ඉහත සඳහන් එක් එක් ස්ථානයේ එකී සේවාවන් සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර එකී එක් එක් ටෙන්ඩර් පත්‍රය උදෙසා රුපියල් 10 බැගින් ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ යුතු වේ.

3. යාපනයේ කෘෂිකර්ම කායඖලයේ කෘෂිකර්ම නිලධාරි (ගො.පා.හා.නි.) ගෙන් ලබාගත් ආකෘති පත්‍ර වල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර දෙපිටපතකින් අත්සන් තබා මුද්‍රා තබන ලද කවරවල බහා එවිය යුතුයි. කවරයේ ඉහළ වම් කෙළවරේ (ස්ථානයේ නම සහ සේවාව සඳහන් කරන්න) සඳහා ටෙන්ඩර් පත්‍රයයි, යනුවෙන් සඳහන් කොට යාපනයේ කෘෂිකර්ම කායඖලයේ කෘෂිකර්ම නිලධාරි (ගො.පා.හා.නි.) වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවන්නේ නම් සීල් තබන ලද කවරවල බහා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයා විසින් යාපනයේ කෘෂිකර්ම නිලධාරි කායඖලයේ (ගො.පා.හා.නි.) ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලිය යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කළ පසු ලියාපදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර් පත්‍රිකා එවන ලද ටෙන්ඩර්කරුවන් වෙත එම ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බව දන්වා එවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් සඳහන් දින සිට දින හතරක් ඇතුළත ටෙන්ඩර් පත්‍රය ලැබුණු බවට එවැනි ලිපියක් කිසියම් ටෙන්ඩර්කරුවෙකුට නොලැබුණි නම්, ඔහු විසින් යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො.පා.හා.නි.) වෙත ඒ බව නොපමාව දන්විය යුතුය.

4. ටෙන්ඩරයකට රුපියල් 10 බැගින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දින, දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම තැන්පත් මුදල් කැමති කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලස්ථානයේ හෝ තැන්පත් කළ හැකිය. ගිවිසුම් පත්‍රය අත්සන් කළ පසු මේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පත්‍රය පිළිගන්නා ලද බව දැන්වූ දින සිට දින දහයක් ඇතුළත ගිවිසුම් පත්‍රයට අත්සන් තැබීමට පිළිගත් ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමටද හේතු වේ. එහෙත් එයින් රජයට ඔහුගෙන් අයවිය යුතු වෙනත් මුදලක් ඇතොත් එම අයකර ගැනීම්වලට බාධාවක් ඇති නොවේ. ගොවිපල කළමනාකරු විසින් නියම කරන ලද දිනයක වැඩ ආරම්භ කර, අදල දිනයට වැඩය නිමකර දිය යුතුයි. එසේ නොකරන්නාවූ ටෙන්ඩර්කරුවන්ට ගිවිසුම් පත්‍රයෙහි සඳහන් වන අලාභය ගෙවීමටද සිදු වේ.

5. ටෙන්ඩර්කරුගේ අභිමතය පරිදි අවශ්‍ය නම් ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන විට පැමිණ සිටීමට ඔවුන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දින වශයෙන් ඉහතින් දක්වා ඇති දින එකී වේලාවට යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො.පා.හා.නි.) තැනගේ කායඖල යේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. පිළිගත් පෝර්මයෙහි (දෙපිටපතකින් යුතුව) ඉදිරිපත් නොකරන ලද හෝ එහි සඳහන් කොන්දේසිවලට සම්පූර්ණයෙන්ම එකඟ නොවන්නාවූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් පිළිගනු නොලැබේ. ටෙන්ඩර් ගාස්තු ප්‍රමාණ හා මිළ ගණන් තීන්තෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතු අතර, සියළුම වෙනස් කිරීම්වලට ටෙන්ඩර්කරුගේ අත්සන යොදා සහතික කළ යුතු වේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ නම් සහ ලිපිනයන් සම්පූර්ණ ලෙස පැහැදිළි අකුරින් සටහන් කර තිබිය යුතුය.

8. පිළිගත් ටෙන්ඩර්කරුට ගිවිසුමකට එළඹීමට සිදුවන අතරම ටෙන්ඩර් කරන ලදුව පිළිගනු ලැබුවාවූ වැඩ කොටස්වල මුලු වටිනාකමින් 5%ක මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමට සිදුවේ. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සාර්ථක ලෙස ඉටු කළ පසුය. පිළිගත් ටෙන්ඩර්කරුට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කර, රජය මගින් තබා ඇති වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයෙහි එම ටෙන්ඩර් කරුගේ නමද ඇතුළත් කරනවා ඇත.

9. ගිවිසුම් පත්‍රයට අලවන මුද්දර සඳහා තම අතින් වියදම් කිරීමට පිළිගත් ටෙන්ඩර්කරුට සිදු වේ.

10. අසතුටුදයක වැඩ කටයුතු නිසා හෝ කොන්ත්‍රාත්තුවේ සඳහන් නියමයන් ඉටු නොකිරීම නිසා හෝ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේය. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුගේ වියදමින් එම වැඩ සම්පූර්ණ කර ගැනීම සඳහා වෙනත් විධිවිධාන යොදා ගැනීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේය.

11. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ, හෝ ටෙන්ඩරයක හෝ ටෙන්ඩර්වල කොටසක් පමණක් පිළිගැනීමේ අයිතිය රජය සතු වේ.

12. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට සති තුනක් තුළ භාර ගැනීම සඳහා තම ටෙන්ඩර් පත්‍ර විවෘතව තැබීමට ටෙන්ඩර්කරුවන්ට සිදු වේ.

13. මේ කොන්ත්‍රාත්තුව යටතේවූ වැඩ කරවාගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත් කරු මෙයින් එකඟ වෙන අතර ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන් නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අයගෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතරම එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා " ලාංකික " යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රට වැසියෙකු බව අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකම සාධාරණ වූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධ යෙන් දනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද, වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු කෙරෙහි එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කර බැලීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයකට තැපෑලෙන් යැව්ව හොත් හෝ ඔහු අතටම භාර දුන්නා සේ සලකනු ලැබේ.

15. කොන්ත්‍රාත්කරුවෙකු විසින් සේවයේ යොදවන කම්කරුවෙකු විසින් වර්ෂ 1934 අංක 19 වෙනි කම්කරු වන්දි ආඥපනතෙහි (117 වෙනි අධිකාරය යටතේ) ඉල්වනු ලබන වන්දියකින් රජය නිදහස් කිරීමට කොන් ත්‍රාත්කරුට සිදු වේ.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇති වන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථාන යත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. '' ලාංකික '' යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. '' ගොවිජන සේවා සහකාර කොමසාරිස් '' යනුවෙන් හැඳින්වෙන්නේ දනට ලංකාණ්ඩුව යටතේ එම තනතුර දරණ නිලධාරී තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත් කරු විසින් සැපයිය යුතුය.

13. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 සැප්තැම්බර් මස 12 දින පෙ. ව. 9.30ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක..

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

අ. සේ. ගුනතිලක,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කොළඹ දිස්ත්‍රික්කය.

කොළඹ දිස්ත්‍රික්කයේ,
ගොවි ජන සේවා සහකාර කොමසාරිස් තැන ගේ කාර්යාලය,
1969 සැප්කැම්බර් මස 14 දින දීය.

8–1106—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ද්‍රව්‍යය විකිණීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1969.9.8 වැනි දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ.

කොකෝ ඇට රාත්තල් 742 යි

2. කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයීය කාර්යාලයෙන් ටෙන්ඩර් අයදුම් පත් ලබා ගෙන ටෙන්ඩර් පත්‍රයෙහි (පෝර්ම) ඔබගේ වැඩිම මිළ ගණන සඳහන් කර අනු පිටපතක් සහිතව ලියුම් කවරයක බහා මුද්‍රා කර ''කොකෝ ඇට මිළට ගැනීම'' යන්න ලියුම් කවරයේ වම් කෙළවරේ සඳහන් කර සභාපති, කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම විද්‍යාලය, කුණ්ඩසාලේ, යන ලිපිනයට ලේඛන ගත තැපැලෙන් එවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට නියමිත අවසාන දින දහවල් 12 වන තුරු ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. එම නිකුත් කිරීම කරනුයේ, එක් ටෙන්ඩර් පෝර්මයක් වෙනුවෙන් රු. 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් පමණි. මුදල් තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළ හැක.

4. ටෙන්ඩර් කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී එනම්, 1969.9.8 දින පස්වරු 2.30ට ඉදිරියෙහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත ඉහතකී දිනයේදී ඉහතකී වේලාවේදී කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

5. කොන්දේසි නොමැති වන අතර, ටෙන්ඩර් ස්ථිර විය යුතුයි. ටෙන්ඩර් පත් එවීමට අදහස් කරන්නවුන්ට කුණ්ඩසාලේ, පාසැල් ගොවිපලේ කළමනාකරු හමුවී කාර්යාල වේලාවන් තුල සඳහන් කොකෝ ඇට තොගය පරීක්ෂා කළ හැක.

6. තෝරාගත් ටෙන්ඩර් කරුවන් විසින් ඒ බව ඔවුන්ට දන්වා සත් දිනක් තුල එහි සඳහන් මුලු මුදල ගෙවිය යුතුයි. මුදල ගෙවා දින දහ හතරක් තුල එම බඩු ගෙන යා යුතුයි. ටෙන්ඩර් කරු විසින් දෙන ලද ලිපිනයට තැපැලෙන් යැවීමෙන් හෝ එහි සඳහන් ස්ථානයේ තැබීමෙන් හෝ ටෙන්ඩරය භාර ගත් බව ඔහුට දන්වූවා සේ සලකනවා ඇත. කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වෙන අන්දමකට තීරණය නොකළහොත්, නියමිත කාල සීමාව තුලදී ගෙන නොහොස් ගබඩාවේ ඉතිරිවෙන බඩු නැවත විකුණා දැමීමට හෝ වෙනත් සුදුස්සක් කිරීමට හෝ ඉඩ තිබේ. එවිට ටෙන්ඩර්කරුවන්ට ඒවා ගැන කිසිම අයිතිවාසිකමක් ඉදිරිපත් කළ නොහැක.

7. (අ) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට කලින් ටෙන්ඩරය අස්කරගන්නා බව නොදන්නුවහොත් හෝ (ආ) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට කලින් ඒවා නොඑවුවහොත් හෝ (ඇ) ටෙන්ඩරය තෝරා ගත් බව දන්වීමෙන් පසුව නියමිත කාල සීමාව තුලදී මුදල් නොගෙවා හෝ බඩු ඉවත් නොකර හෝ හැරියහොත්, තැන්පත් මුදල රාජසන්තක කරනවා ඇත.

8. තෝරාගත් ටෙන්ඩර් කරුවෙකු බඩු ගෙනයාම ප්‍රතික්ෂේප කළ හොත් හෝ ගෙනයාමට බැරිවුවහොත් තැන්පත් මුදල රාජසන්තක කරනු හැර, කොන්දේසි කඩකරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයේ ඔහුගේ නම ඇතුලත් කිරීමටද ඉඩ තිබේ.

9. කිසිම හේතුවක් නො දක්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට ඇත.

ජී. ටී. ජිනේන්ද්‍රදස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක,
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපලවල්).

1969.8.6 වෙනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දීය.

8–1021—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

කොළඹ දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1969 සැප්තැම්බර් මස 4 දින දහවල් 12 දක්වා කොළඹ දිසාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

වැඩ විස්තර

(i) මීරිගම ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ නරනාපිටිය ජනපදයේ පාරට බෝක්කු තැනීම ;

(ii) මීරිගම ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ පරගොඩ ජනපදයේ පාරට බෝක්කු තැනීම ;

(iii) මීරිගම ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ ගස්පේ ජනපද පාරට බෝක්කුවක් තැනීම ;

(iv) මීරිගම ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ දොරොව්ව ජනපදයට බෝක්කුවක් තැනීම ;

(v) අත්තනගල්ල ඡන්ද කොට්ඨාශයේ දෙමටලන්ද ජනපදයට බෝක්කු තැනීම ;

(vi) මීරිගම ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ මුරුතවල වත්ත පාරවල් සඳහා බෝක්කු තැනීම.

2. රු. 15,000 කට හෝ ඊට වැඩි ගණනකට රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට 1969 සැප්තැම්බර් මස 2 දින දවල් 12 දක්වා කොළඹ දිසාපති විසින් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයා විසින් රු. 25 ක් ඕනෑම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ තැන්පත් කළ කුවිතාන්සියක් ඉදිරිපත් කර ටෙන්ඩර් පෝර්ම කොළඹ දිසාපති කාර්යාලයෙන් ලබාගත යුතුය.

4. දිස්ත්‍රික්කයේ සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති ආදියට ද, ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකි අතර එවැනි සමිති ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට නියමිත තැන්පත් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සි ඉදිරිපත් කළ යුතු අතර එවැනි සමිති වලින් ටෙන්ඩරය සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල් බැඳීමෙන් නිදහස්ය.

5. පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර වම් පස වැඩවල නම් වෙනම සඳහන් කවරයක දමා ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු අතර තැපැලෙන් නො එවන්නේ නම් කොළඹ දිසාපති කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

6. 1969 සැප්තැම්බර් මස 4 දින් දහවල් 12 ට කොළඹ දිසාපති කාර්යාලයේ උප දිසාපති තුමාගේ කාමරයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අතර එකී වේලාවට ටෙන්ඩර් කරුවන්ට හෝ නියෝජිතයින්ට හෝ පැමිණ සිටිය හැක.

7. වැඩි විස්තර කොළඹ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් ලබාගත හැක.

ඩී. ජී. පල්ලියගුරු,
කොළඹ දිසාපති වෙනුවට.

1969 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ කච්චේරියේ දී ය.

8—1061—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

## ආහාර දෙපාර්තමේන්තුව

### ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි

කොළඹ මැනිං වෙළඳ සැලෙහි හා කොළඹ වාමස් ධාන්‍යාගාරයේ තිබෙන 43,965ක් පමණ වූ ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පත් 1969 සැප්තැම්බර් 5 වෙනි සිකුරාද දින සවස 2.30 දක්වා අංක 330, යූනියන් පෙදෙසේ ආහාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

රු. 450 ක් තැන්පත් කිරීමෙන් පසුව මෙම කාර්යාලයෙන් ලබාගත හැකි පෝරම් වල ටෙන්ඩර් පිළියෙල කළ යුතුය. ටෙන්ඩර් පිළිබඳ විස්තර වාර්තාවක් මෙම කාර්යාලයෙන් ඉල්ලුම් කළ විට ලබාගත හැකි වේ.

ආ. මතියාපරනම්,
ආහාර කොමසාරිස් වෙනුවට.

1969 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ, 330, යූනියන් පෙදෙසේ දී ය.

8–1144—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් මහගල්වැව ව්‍යාපාරයේ ගොඩනැගිලි ඉදිකිරීම

අංක 14,860 හා 1969.6.27 දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පලවූ ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීමේ දිනය හා ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනයන් පහත සඳහන් අයුරින් දීර්ඝ කර ඇත:—

(අ) ටෙන්ඩර් ලියකියවිලි 1969 අගෝස්තු මස 23 දින දවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

(ආ) ටෙන්ඩර් පත්‍ර 1969 අගෝස්තු මස 24 වැනි දින පෙරවරු 11.30 වනතෙක් භාර ගනු ලැබේ. එදිනම පස්වරු 3.30 ට ටෙන්ඩර් විවෘත් කරනු ලැබේ.

ඉඩම් සංවර්ධන නිලධාරි,
චන්ද්‍රිකාවැව.

ඉඩම් සංවර්ධන කාර්යාලය,
චන්ද්‍රිකාවැව, පදලංගල,
1969 අගෝස්තු මස 7 දින.

8–966—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### අම්පාරේ යුනිට් 21 ජලසම්පාදන ව්‍යාපාරයෙහි නල මාර්ගයක් සවි කිරීම

ඉහත සඳහන් සේවය සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1969.9.5 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 1969.9.4 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන ගෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතකුත් සමඟ ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්‍යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්‍යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 25 ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. රිසිට් පත් තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් බහාලූ ලියුම් කවරයේ වම්පස කෙළවරේ " අම්පාරේ යුනිට් 21 ජලසම්පාදන ව්‍යාපාරයෙහි නල මාර්ගයක් සවිකිරීම සඳහා ටෙන්ඩර් " යනුවෙන් සඳහන් කොට කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපැලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිත යෙකු විසින් ප්‍රධාන ගණකාධිකාරී තැන වෙත භාර දීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිරවූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදල නොවිය යුත්තේය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 30ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේ ය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් 1969 සැප්තැම්බර් මස 30 වැනි දින හෝ ඊට පෙර වැඩය නිමකළ යුතුය.

8. සාර්ථක වූ ටෙන්ඩර් කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ දැන් වූ කල්හි පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ටෙන්ඩර්කරුගේ නම ද රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේ ය.

9. කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1969.9.5 වන දින පෙ.ව. 11.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. ටෙන්ඩර්කරුවන් විසින් මෙවැනි වැඩ සඳහා ඔවුන්ගේ පළපුරුදුකම හා දක්ෂතාවය ටෙන්ඩර් පෝරම ඉල්ලීමේදී ඔප්පු කළ යුතුය.

11. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත් කරු එකඟවිය යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12. ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් භාරගැනීමේ බලය රජය සතුවේ.

13. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සීටී/2/386.
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය, කොළඹ, 69.8.15.

8–1096—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## ජනසතුසේවා හා ක්‍රීඩා පිළිබඳ අමාත්‍යාංශය

### රෙදි ඇපිල්ලීම සඳහා මිල ගණන් කැඳවීම

කොළඹ 7, ටොරින්ටන් පෙදෙසේ අංක 33 දරණ ස්ථානයෙහි ජනසතු සේවා හා ක්‍රීඩා පිළිබඳ අමාත්‍යාංශයෙහි, ක්‍රීඩා අංශයේ ක්‍රීඩා අධ්‍යක්ෂ තැන විසින් එම අංශයේ ක්‍රීඩා මන්දිරයේ ඇති පහත සඳහන් රෙදි පිළි සේදීම සඳහා සීල් තබන ලද මිල ගණන් ලාංකික රෙදි පිරිසිදු කරන්නන්ගෙන් සහ ආයතන වලින් කැඳවනු ලැබේ :—

| | |
|---|---|
| දොර රෙදි | ජනෙල් රෙදි |
| මේස රෙදි | ඇඳ ඇතිරිලි |
| කොට්ට උර | ඩස්ටර් |
| ඒප්‍රන් | තුවා |
| ක්‍රීඩකයින්ගේ ජර්සි | ක්‍රීඩකයින්ගේ දිග මේස් |

ක්‍රීඩකයින්ගේ ජර්සි, අත්දිග, අත්කොට

මෙම මිල ගණන් 1969.8.31 දින පෙ.ව. 10 ට පෙර පහත අත්සන් තබන ක්‍රීඩා අධ්‍යක්ෂ තැන විසින් භාර ගනු ලැබේ. මිළ ගණන් බහාලන කවර යෙහි වම්පස ඉහළ කෙළවරේ " රෙදිපිළි සේදීම " කියා සටහන් කර සීල් තබා එවිය යුතුයි. මෙම මිළ ගණන් එදිනම පෙ.ව. 11.15 ට විවෘත කරනු ලැබේ. මිළ ගණන් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

ටෙන්ඩරයක් සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ක්‍රීඩා අධ්‍යක්ෂ සතුය. තෝරා ගන්නා ටෙන්ඩර් කරු අවශ්‍ය වුවහොත් රු. 1000 වැඩි නොවන තැන්පත් මුදල් තැබීමට එකඟ විය යුතුය.

කේ. ඇස්. කුලතුංග,
ක්‍රීඩා අධ්‍යක්ෂ වෙනුවට.

1969 අගෝස්තු මස 15 වෙනි දින.
ක්‍රීඩා අංශය, ජනසතු සේවා අමාත්‍යාංශය,
33, ටොරින්ටන් පෙදෙස,
කොළඹ 7.

8–1097—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

## ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

විස්කෝස් රෙයෝන් නූල් ලබාගැනීම සඳහා ඒවා නිපදවන්නන්ගෙන් සහ ඔවුන්ගේ නියෝජිතයින්ගෙන්, ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1969 සැප්තැම්බර් මස 20 වැනි දින පෙවරු 10 දක්වා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර සහ ටෙන්ඩර් පත් ලබාගැනීම සඳහා ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව විමසන්න.

පී. එච්. පී .ද සිල්වා,
ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව අංක : ඩීජ්/ඩී/25/46 (3/69),
ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
කොළඹ 7, 1969 අගෝස්තු මස 13 වැනි දින.

8–1013—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

නාත්තන්ඩිය විදුලිබල පේෂ කර්මාන්ත ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1969 සැප්තැම්බර් 13 වැනි දින පෙ. ව. 10. දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. පහත සඳහන් දෙපාර්තමේන්තුවක රු. 15,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැක :—

1. රජයේ වැඩ දෙපාර්තමේන්තුව ;
2. වාරිමාර්ග දෙපාර්තමේන්තුව ;
3. දුම්රිය දෙපාර්තමේන්තුව ;
4. අධ්‍යාපන දෙපාර්තමේන්තුව ;
5. ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉන්ජිනේරු දෙපාර්තමේන්තුව.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමැති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 100 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1969 සැප්තැම්බර් 11 වැනි දින දවල් 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත්කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

පී. එච්. පී. ද සිල්වා,
අධ්‍යක්ෂ,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව.

යොමුව : ඩීජ්/ඩී/193,
1969 අගෝස්තු මස 10 දින,
කොළඹ 7.

8–1011—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

අංකය : මආ/නිනි/52/69.

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

### නිවර්තන නිවාසයේ මියයන්නන් වැළලීම

1969 ඔක්තෝබර් 1 වෙනිදයින් ඇරඹෙන අවුරුද්ද තුළ බොරලැස්ගමුවේ නිවර්තන නිවාසයේ මිය යන්නන් වැළලීම සඳහා ටෙන්ඩර් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් ඇප මුදල වශයෙන් රු. 10 ක් කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ කල්හි, කොළඹ 3, ඛාලදක්ෂ මාවතේ සමාජ සේවා අධ්‍යක්ෂ තැනගෙන් ලබාගතහැකි ආකෘතියක ටෙන්ඩරය ලියා එහි අනු පිටපතක් ද ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර්කරුවන් ලංකා පුරවැසියන් විය යුතුයි.

3. ලියුම් කවරයේ වම් කෙළවරේ " මිනී වැළලීම සඳහා ටෙන්ඩර් " යනුවෙන් සටහන් කළ මුද්‍රා තැබූ ටෙන්ඩර් 1969 සැප්තැම්බර් 15 වෙනි සඳුද පෙ. ව. 9.30 ට පෙර සමාජ සේවා අධ්‍යක්ෂ තැන වෙත ලැබෙන සේ එවිය යුතුයි.

4. ටෙන්ඩර් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ඇති ටෙන්ඩර් පෙට්ටිය තුළට බහාලීම හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් එවීම හෝ කටයුතු වේ. තම ටෙන්ඩර් ලියා පදිංචිකළ තැපෑලෙන් එවීමට බලාපොරොත්තු නොවන ටෙන්ඩර් කරුවන් ඒවා පෞද්ගලිකව අතින්ම හෝ නියෝජිතයන් මගින් (ලියුම් කවරයේ පිට පැත්තේ ටෙන්ඩර් කරුගේ නම, ලිපිනය හා සේවය පිළිබඳ විස්තර ද දැක්විය යුතුයි. මේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ලිපිකරු තැනට භාරදී ඔහුගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් විවෘත කරනු ලබන වේලාවේ පැමිණ සටීමට කැමති නම් එසේ කිරීමට ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන් විසින් බලය පවරන ලද නියෝජිතයින්ට හෝ අවසර දෙනු ලැබේ.

6. 1969 සැප්තැම්බර් මස 15 වෙන් සඳුද පෙ. ව. 10.00 ට සමාජ සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනයේ සිට සති 6 ක් ගතවන තෙක් ටෙන්ඩර් කරුවන් බලාපොරොත්තු වන ගණන් නොවෙනස්ව තබා ගතයුතු බැව් අපේක්ෂිතය.

8. ටෙන්ඩර් පිළිගැනීමේදී කොන්ත්‍රාත්තුව හරියාකාර ඉටු කරන බවට ඇප කරුවන් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වුවහොත්, සපල වූ ටෙන්ඩරය හිමියා එසේ කිරීමට හැකි තත්ත්වයක සිටිය යුතු වේ.

9. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 සැපතැම්බර් 13 වෙනි සෙනසුරාද දවල් 12 න් පසු නිකුත් කරනු නොලැබේ. නියමිත ආකෘතියෙහි නොලියා වුණු ටෙන්ඩර් ගැන සලකා බැලීමක් නොකෙරේ.

10. වැඩිදුර විස්තර සමාජ සේවා අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකිය.

ජේ. සී. පෙරේරා,
සමාජ සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1969 අගෝස්තු මස 8 වැනි දින,
කොළඹ දීය.

8–1007—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## මිනින්දෝරු දෙපාර්තමේන්තුව

සේවයට අයෝග්‍ය පහත දැක්වෙන බඩු මිලදී ගැනීම හා ඉවත් කිරීම සඳහා මිළ ගණන් කැඳවනු ලැබේ:—

| | |
|---|---|
| ඇකිළිය හැකි බුරු ඇඳන් (කැන්වස් රහිතව) 10 බැගින් වූ මිටි වලින් ... ... ... | 1,234 |
| පරණ ෂොක් ඇබ්සෝබර් ... ... ... | 46 |
| කුඩාරම් කවර (තද නිල්) ... ... ... | 20 |
| පැතලි කල ගැල්වනයිස් පිප්ප සහ බාල්දි (වයි, ඉසෙඩ්, ජීජ්, බීබී යනුවෙන් ලකුණු කර ඇත) තොග ... ... | 4 |
| පරණ ටයර් (ජීප්) ... ... ... | 89 |

2. මිටි හෝ සම්පූර්ණ තොගය සඳහා මිළ ගණන් ලිපි මගින් දන්වා එවිය යුතුය. එම ලිපි මුද්‍රා තැබූ කවරයක බහා, 1969. 9.2 වැනි දින දවල් 12.00 ට පෙර, කොළඹ 5, තැ.පෙ. 506, සර්වේ ජනරාල් කාර්යාලයේ ගබඩා අංශය වෙත ලැබෙන ලෙස එවිය යුතු අතර, කවරයේ වම් පස මුදුනේ " සේවයට අයෝග්‍ය බඩු සඳහා මිළ ගණන් " යනුවෙන් සඳහන් කළ යුතුය. එලෙස මිළ ගණන් ඉදිරිපත් කල අයට ඒවා විවෘත කරන අවස්ථාවේ දී එහි පැමිණ සිටීමට අවසර තිබේ.

3. සාර්ථක ඉල්ලුම්කරු විසින්, සර්වේ ජනරාල් විසින් නියම කරනු ලබන දිනයක සම්පූර්ණ මුදල් ප්‍රමාණය ගෙවා, එදිනම සම්පූර්ණ බඩු තොගය ඉවත් කළ යුතු වන්නේය.

4. සේවයට අයෝග්‍ය මෙම බඩු ඕනෑම වැඩ දිනක පෙරවරු 10 සිට දවල් 12 දක්වා පරීක්ෂා කර බැලිය හැක.

ඒ. තම්බිරාජා,
වැ. බ. සර්වේ ජනරාල් වෙනුවට.

1969 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ 5, සර්වේ ජනරාල් කාර්යාලයේ,
ගබඩා අංශයේ දී ය.

8—1147—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

8. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, පුහුණු නුපුහුණු යන දෙවර්ග යේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත් කරු මෙයින් එකඟවන අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නා හ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

9. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත් කරුවා යම් විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩුදෙනවා ඇත. එහෙත්, කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවල දී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය උඩ නිශ්චිතව, ලියවිල්ල කින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

10. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුවෙ අභිප්‍රාය සඳහා ''ලාංකික'' යන්නෙන්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලාංකාවේ රටවැසියෙකු ලෙස අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

12. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූ ද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධ යෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූ ද, වේතන ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

13. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම් කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත පෙරෙට්ටු පොත් හා අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කාමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරිමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු බදුල්ල දිසාපති ගෙන් දැනගත හැකිය.

ජී. සී. දිසානායක,
උප දිසාපති,
බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

දිසාපති කාර්යාලය,
බදුල්ල,
1969 අගෝස්තු 10 වැනි දින.

8–994—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ, තැ.පෙ. අංක 500 යේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති තැන විසින් කුරුණෑගල රෝහලේ පල්දෝරු ක්‍රමයක් ඉදි කිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1969 නොවැම්බර් මස 25 වන අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7, පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1969 ඔක්තෝබර් මස 23 වන බ්‍රහස්පතින්ද පස්වරු 4වන තෙක් නිකුත් කරනු ලබන්නේ පල්දෝරු ක්‍රම ඉදි කිරීම සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ ''ඒ හෝ බී'' කොටස යටතේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන ගේ නමට අය වන ලෙස කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් ලබා ගැනීම වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කොට ඇති පහත සඳහන් සංගම් වලට ද ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කොට ඇති ග්‍රාම සංවර්ධන සමිති,

(ඇ) සමුපකාර සංගම් රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කොට ඇති සමුපකාර සංගම්.

4. ටෙන්ඩර් පත් කොළඹ, ගාළු මුවදෙර පිහිටි මහා ලේකම් ගොඩනැගිල්ලේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩල කාර්යාලයේ තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. නැතහොත් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ ටෙන්ඩර් පත් පිළිගැනීමේ බලය ලබා ඇති නිළධාරියෙකුට භාර දිය හැකිය. සේවයේ විස්තර ද, ටෙන්ඩර්කරුවන් ගේ නම් සහ ලිපිනය ද, කවරයේ සඳහන් කළ යුතුය. ටෙන්ඩරය භාරගත් බවට ඉහත සඳහන් නිළධාරිතැන විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

5. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේ දී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී සෑම ඉල්ලුම්කරුවෙකුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිළ ගණන් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි දී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩර යක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

6. මෙම වැඩයට උවමනා සිමෙන්ති ප්‍රමාණය මිළ දී ගැනීමට අවශ්‍ය අවසර පත්තරය ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයෙන් හෝ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ ලබාගැනීම සඳහා නියමිත නිර්දේශය සාර්ථක ටෙන්ඩර්කරු වෙත නිකුත් කරනු ලැබේ.

7. මෙම වැඩය සඳහා අවශ්‍ය, මෙරටින් ලබා ගත නොහැකි බඩු බාහිරාදිය ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා ගැනීමද නිර්දේශ කරනු ලැබේ.

8. වැඩය පිළිබඳ තව දුරටත් විස්තර කොළඹ 7, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඇස්. ඊ. ජේ. මෛකර්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන.

1969 අගෝස්තු මස 15 වනද,
කොළඹ 7, තැ. පෙ. 1434 දී.

8–1099—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 සැප්තැම්බර් මස 6 වන දින පෙ.ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර තංගල්ල අධ්‍යාපන කාර්යාලයයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසලේ නම | | කළ යුතු වැඩය | | අවශ්‍ය ලියා පදිංචිය | |
|---|---|---|---|---|---|
| | | | | රු. | ශ. |
| හ/රළුව විදුහල | ... | 60′ × 20′ ගොඩනැගිල්ල | ... | 15,000 | 0 |

සංලක්ෂය : හ = හම්බන්තොට දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ විදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාලයේ රු. 100 (සියය) ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය තංගල්ලේ, ප්‍රධාන අධ්‍යාපන නිලධාරී වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 15,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 සැප්තැම්බර මස 5 වනද දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නො වෙත්.) චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම්, ආදිය භාරගනු නො ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2 මැලේවීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ තංගල්ලේ, ප්‍රධාන අධ්‍යාපන නිලධාරීගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැකි ය. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡෙදවල සඳහන් පරිදි තංගල්ල ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර, සැලැස්ම ආදිය බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් තංගල්ල, අධ්‍යාපන කාර්යාලයයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිළිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පෞද්ගලිකව තංගල්ල අධ්‍යාපන කාර්යාලයේ, කාර්යාල සහකාර/ප්‍රධාන ලිපිකරු වෙත භාරදිය යුතු ය. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතු ය.

5. 1969 සැප්තැම්බර මස 6 වන දින ප.ව. 2.30 ට තංගල්ල අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන වේලා වේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමැතිවිය යුතු ය.

7. තවත් අවශ්‍ය විස්තරයක් වෙතොත් තංගල්ලේ, ප්‍රධාන අධ්‍යාපන නිලධාරීගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් කරන ලද පාසල් ගොඩනැඟිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මඟින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සළකනු ලැබේ.

එම්. වැන්දබෝනා,
හම්බන්තොට ප්‍රදේශයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි.

1969 අගෝස්තු මස 13 දින,
තංගල්ලේ, අධ්‍යාපන කාර්යාලයයේදී ය.

8–1028/1—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 සැප්තැම්බර මස 6 වන දින පෙ.ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර මාතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාසලේ නම | කළ යුතු වැඩය | අවශ්‍ය ලියා පදිංචිය රු. ශ. |
|---|---|---|
| හ/වීරකැටිය ම.ම. විදුහල... | වානිජ පන්ති කාමරය තැනීම... | 20,000 0 |

සංලක්ෂය : හ = හම්බන්තොට දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාලයේ රු. 100/- (සියය) ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය තංගල්ලේ, ප්‍රධාන අධ්‍යාපන නිලධාරි වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 20,000/- හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, ගොඩනැඟිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 සැප්තැම්බර මස 5 වනද දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000/-කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නො වෙත්.) චැක්පත්, මුදල් ඇණැවුම්, තැපැල් ඇණැවුම්, ආදිය භාරගනු නො ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා-සංස්කෘතික අමාත්‍යාංශයේ පාසල් ගොඩනැඟිලි ශාඛාවෙන් හෝ තංගල්ලේ, ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡෙදයේ සඳහන්කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැකි ය. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡෙදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡෙදවල සඳහන් පරිදි තංගල්ල ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනැගත හැකි අතර, සැලැස්ම ආදිය බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් මාතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතු ය. තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිළිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පෞද්ගලිකව මාතර අධ්‍යාපන කාර්යාලයේ, කාර්යාල සහකාර/ප්‍රධාන ලිපිකරු වෙත භාරදිය යුතු ය. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතු ය.

5. 1969 සැප්තැම්බර මස 6 වන දින ප.ව. 2.30 ට මාතර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමැති විය යුතු ය.

7. තවත් අවශ්‍ය විස්තරයක් වෙතොත් තංගල්ලේ, ප්‍රධාන අධ්‍යාපන නිලධාරීගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් කරන ලද පාසල් ගොඩනැඟිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික-- අමාත්‍යාංශය මඟින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සළකනු ලැබේ.

එම්. වැන්දබෝනා,
හම්බන්තොට ප්‍රදේශයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි.

1969 අගෝස්තු මස 13 දින,
තංගල්ලේ, අධ්‍යාපන කාර්යාලයයේ දීය.

8–1028/2—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාද පෙ.ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර මාතලේ අධ්‍යාපන කායර්‍ාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| | පාඨශාලාවේ නම | | වැඩයේ ස්වභාවය |
|---|---|---|---|
| 1. | මා/කන්ඩලම විද්‍යාලය (අංක 1) | ... | ගුරු නිවාසය අලුත්වැඩියා කිරීම |
| 2. | මා/තැන්න විද්‍යාලය | ... | ජල සේවය වැඩිදියුණු කිරීම |
| 3. | මා/ඔවිලිකන්ද විද්‍යාලය | ... | වැසිකිළි හා කැසිකිළි තැනීම |
| 4. | මා/ඉනාමලුව විද්‍යාලය | ... | වැසිකිළියක් තැනීම |
| 5. | මා/කලුන්දෑව විද්‍යාලය | ... | වැසිකිළියක් තැනීම |
| 6. | මා/විද්‍යා මහා විද්‍යාලය | ... | ගේට්ටුව ආදිය |

සංලක්ෂය : මා = මාතලේ දිස්ත්‍රික්කය

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කායර්‍ාලයේ හෝ මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන කායර්‍ාලයේ දී රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය මාතලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 5,000 කට හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට 1969 සැප්තැම්බර් මස 11 වැනි බ්‍රහස්පතින්ද දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන කායර්‍ාලයෙන් හෝ මාතලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරී තැනගෙන් හෝ ලබා ගත හැක. මුදල් බාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡෙදවල සඳහන් පරිදි මාතලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියා පදිංචි තැපැලෙන් මාතලේ අධ්‍යාපන කායර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරුගේ හෝ ඔහුගේ නියෝජිත යෙකු විසින් පුද්ගලිකව මාතලේ අධ්‍යාපන කායර්‍යාලයේ ප්‍රධාන ලිපිකාර වෙත භාරදිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාද පෙ.ව. 10.30 ට මාතලේ අධ්‍යාපන කායර්‍යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කල දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මාතලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගේ කායර්‍යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කායර්‍යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී 1966.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියා පදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියා පදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීම් කටයුතු සඳහා සලකනු ලැබේ.

ඩී. වී. බී. විලත්ගමුව,
මාතලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි.

1969 අගෝස්තු මස 11 දින,
මාතලේ, අධ්‍යාපන කායර්‍යාලයේ දීය.

8–1003—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාද ප.ව. 2.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර, මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ:—

| පාඨශාලාවේ නම | | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| 1. මහ/රඹුක්පොත විද්‍යාලය | ... | වහල අලුත්වැඩියාව |
| 2. මහ/වලල ම.ම. විද්‍යාලය | ... | වහල අලුත්වැඩියාව |
| 3. මහ/ගිරිහාගම විද්‍යාලය | ... | 80′ × 20′ පාසැල් ගොඩනැගිල්ල |
| 4. මහ/කපුලියද්ද විද්‍යාලය | ... | 60′ × 20′ පැසැල් ගොඩනැගිල්ල |
| 5. මහ/විලානගම විද්‍යාලය | ... | 120′ × 20′ පාසැල් ගොඩනැගිල්ල— වැසිකිළි හා කැසිකිළි |

සංලක්ෂ්‍යය.—මහ = මහනුවර ප්‍රදේශය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් වැඩ අංක 1 සිට 2 දක්වා රු. 10,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 3 සිට 4 දක්වා රු. 20,000 හා ඊට වැඩි ගණනකට, වැඩ අංක 5 රු. 35,000 හා ඊට වැඩි ගණනකට, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 සැප්තැම්බර් මස 11 වැනි බ්‍රහස්පතින්ද දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරණු ලැබේ. (වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩුවැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්). චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මහනුවර, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡෙදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 හා 3 වැනි ඡෙදවල සඳහන් පරිදි මහනුවර, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව මහනුවර අධ්‍යාපන කාර්යාලයේ පරිපාලන නිලධාරි වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාද ප.ව. 2.30 ට මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරණු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කල දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

පී. බී. රත්නායක,
මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 14 දින,
මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දීය.

8–1089—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාද පෙ.ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| මහ/පිලිමතලාව මහා විද්‍යාලය | ... | රැස්වීම් ශාලාව |

සංලක්ෂ්‍යය.—මහ = මහනුවර ප්‍රදේශය

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත්කර එම කුවිතාන්සිය මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමනේ රු. 75,000 හා ඊට වැඩි ගණනකට, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 සැප්තැම්බර් මස 11 වැනි බ්‍රහස්පතින්ද දවල් 12 දක්වා වෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුසෝ නොවෙත්). චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මහනුවර, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡෙදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡෙදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 හා 3 වැනි ඡෙදවල සඳහන් පරිදි මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර

දනගත හැකි අතර, සැලැස්ම ආදියද ලබාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාද පෙ.ව. 10.30 ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරණු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කල දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමතිවිය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකරබැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියා පදිංචි කිරීම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියා පදිංචි කිරීම හැටියට මෙම ටෙන්ඩර් දුන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

9. මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාර්යය, උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂමේ යෝජනාවකි.

පී. බී. රත්නායක,
මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 14 දින,
මහනුවර අධ්‍යාපන කාර්යාලයේ දීය.

8–1090—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 සැප්තැම්බර් මස 5 වැනි සිකුරාද පෙ.ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වන වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල යේ ටෙන්ඩර් මංඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| | පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| (1) | මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි කාර්යාලය... | උඩුබද්දව මණ්ඩලය |
| (2) | එම ... | බිංගිරිය මණ්ඩලය |
| (3) | එම ... | පුත්තලම මණ්ඩලය |
| (4) | හලා/ගොඩැල්ල වි. ... ... | වහල අළුත්වැඩියාව |
| (5) | හලා/මාදම්පේ ම.ම.වි. ... ... | මුළුතැන්ගෙය |
| (6) | හලා/පුත්තලම සහිරා කණිෂ්ඨ වි. ... | පාසැල් ගොඩනැගිල්ල |
| (7) | හලා/පුක්කුලම වි. (පුත්තලම දිස්ත්‍රික්කය) | එම |
| (8) | හලා/ඉලන්තියාඩි දෙ.වි. ... | එම |
| (9) | හලා/වඳුරුස්ස ශ්‍රී බුද්ධරක්ඛිත වි. ... | එම |

සංලක්ෂය.—හලා = හලාවත දිස්ත්‍රික්කය

2. හලාවතින් බැහැර ඕනෑම කච්චේරියක හෝ හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1, 2, 3, 4 හා 5 වැඩවලට රු. 5,000 හා ඊට වැඩිගණනකට අංක 6, 7,8 වැඩවලට රු. 18,000 හා ඊට වැඩිගණනකට අංක 9 වැඩවලට රු. 21,000 හා ඊට වැඩිගණකටද අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 සැප්තැම්බර් මස 4 වැනි බ්‍රහස්පතින්ද ප.ව. 3 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩුවැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චැක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල හා බාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කල යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන කාර්යාලයේ පාලන නිලධාරි/ප්‍රධාන ලිපිකාර වෙත භාර දිය යුතුයි. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 සැප්තැම්බර් මස 5 වැනි සිකුරාද පෙ.ව. 10.30 ට හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන් ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාරගැනීම අවසන්කල දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමතිවිය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම හැටියට මෙම ටෙන්ඩර් දුන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

එල්. බී. හේරත්,
හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 අගෝස්තු 14 දින,
හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේදීය.

8–1095—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## පාච්චිකල නොම්මර 1117 ($17\frac{1}{2}'' \times 11''$) ප්‍රමාණයේ "කලමාසු නෝත් පිල්ඩ්" බයින්ඩර්ස් 295ක් විකිණීම

ඉහත සඳහන් භාණ්ඩ සියල්ල එකවිට මිළ දී ගැනීම පිණිස මිළ ගණන් සඳහන් ඉල්ලුම් පත් 1969.9.5 වෙනි දින පෙරවරු 11 දක්වා රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා විසින් භාර ගනු ලැබේ.

මිළ ගණන් සඳහන් ලිපි ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතු අතර ඒවා බහා ලන කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ " කලමාසු බඳනයන් සඳහා " යන්න සඳහන් කළ යුතු ය.

මෙම භාණ්ඩ 1968 අගෝස්තු 25 වෙනි දින සිට 30 වෙනි දින දක්වා කොළඹ 2 හි හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේදී පරීක්ෂා කළ හැක.

රෝ. සමරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

8–1023—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයීය ''ටෙන්ඩර්'' මණ්ඩලයේ සභාපති තැන විසින් ප්‍රධාන මාර්ගයේ, ඌරුගොඩවත්තේ හැතැප්ම 2 යි, දම්වැල් 25 හා හැතැප්ම 2 යි, දම්වැල් 45 අතර අතර දුම්රිය මාර්ගය අද්දරව බොරලු කියුබ් 725 ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 සැප්තැම්බර් මස 19 වැනි සිකුරාද පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාර ගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි .

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද කොළඹ, දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉංජිනේරු තැන වෙත 1969 සැප්තැම්බර් මස 5 වැනි දින පස්වරු 4 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය.

4. මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් පෝර්ම ද කොළඹ, ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉංජිනේරුතැන,
ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

තැ.පෙ. 370, කොළඹ,
1969 අගෝස්තු 13 වැනි දින.

8–1101—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට 1970.9.30 න් අවසන් වන කාලය සඳහා පහත සඳහන් ප්‍රවාහන සේවාවන් සැපයීමට ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ 1, වැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාද අ.භා. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

(1) අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් බිබිලේ මොණරාගල හා බුත්තල පිහිටි එළවළු ඇහිරීමේ මධ්‍යස්ථාන වල සිට සහ බඩල්කුඹුර හා වැල්ලවාය විවිධ සේවා සමූපකාර සමිති වලට අයත් මධ්‍යස්ථාන වල සිට එළවළු හා පළතුරු කොළඹ, මරදානේ පිහිටි ට්‍රිපොලි වෙළඳ සැලට ප්‍රවාහනය කිරීම.

(2) තිස්ස පිහිටි එළවළු ඇහිරීමේ මධ්‍යස්ථානයේ සිට එළවළු හා පළතුරු ගාල්ලට, කොළඹ මරදානේ ට්‍රිපොලි වෙළඳ හලට සහ නාරාහේන්පිට පිහිටි ටින් කිරීමේ කර්මාන්තායතනයට ප්‍රවාහනය කිරීම සහ තංගල්ලේ හා බෙලිඅත්තේ පිහිටි මධ්‍යස්ථාන වලින් පළතුරු හා පැණි හකුරු කොළඹ මරදානේ ට්‍රිපොලි වෙළඳ හලට සහ නාරාහේන්පිට පිහිටි ටින් කිරීමේ කර්මාන්තායතනයට ප්‍රවාහනය කිරීම.

(3) අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් නුවරඑළියේ මධ්‍යස්ථානයේ සිට කොළඹ මරදානේ ට්‍රිපොලි වෙළඳ සැලට එළවළු හා පළතුරු ප්‍රවාහනය කිරීම.

(4) කන්කසන්තුරේ දුම්රිය පොළේ සිට කන්කසන්තුරේ අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ රෝහල් සැපයීමේ ශාඛාවට එහි සිට කන්කසන්තුරේ රෝහල් වලට, තෙල්ලිප්පලෙහි සමූපකාර සංගමය සහ කන්කසන්තුරේ දර ශාඛාවේ සිට රෝහල් සැපයීමේ ශාඛාවට එළවළු, වියලි ද්‍රව්‍ය හා හාල්, කුළුබඩු, දර හා වෙනත් දේ ප්‍රවාහනය කිරීම.

2. කොළඹ 1, වැතැම් වීදියේ අංක 62 දරණ තැන පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100 ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් 1969 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාද දවල් 12 වන තුරු අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

3. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුය. වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ආර්. ඇෆ්. සී. ද ලිවේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට

1969 අගෝස්තු මස 15 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

8–1102—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## දිසාපති කාර්යාලය

වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති විසින් වවුනියාව දිස්ත්‍රික්කයෙහි ක්‍රිස්ටෝ කුලම්හි පොදු ළිඳක් සෑදීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1969 සැප්තැම්බර් මස 15 වෙනි සඳු දින දහවල් 12 දක්වා භාරගනු ලැබේ.

2. සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්ත විය යුතු අතර, ඒවා වවුනියාව දිසාපති කාර්යාලයෙන් ලබා ගන්නා ලද නියමිත පෝර්මවල විය යුතුය. මේ සම්බන්ධ වෙනත් සියලු විස්තර වවුනියාව දිසාපතිගෙන් ලබා ගත හැක. 1969 සැප්තැම්බර් මස 14 වෙනි දින ප.ව. 3. දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. රජයේ දෙපාර්තමේන්තුවල ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවන් සහ ග්‍රාම සංවර්ධන සමිති හා විවිධ සේවා සමූපකාර සමිති වැනි අනුමත කරන ලද සමිති පමණක් ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සෝ වෙති. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයට ටෙන්ඩර් පත්‍ර හා අනිකුත් ලියකියවිලි දෙනු ලබන්නේ ඔවුන් විසින් එම වැඩය වෙනුවෙන් වවුනියා දිසාපති කාර්යාලයේ රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් පසුවය. ග්‍රා. සං. ස. සහ වි. සේ. ස. සමිති එවැනි ටෙන්ඩර් තැන්පත් කිරීම්වලින් නිදහස් කර ඇත.

බී. සී. පෙරේරා,
වවුනියාව දිස්ත්‍රික්කයේ දිසාපති

1969 අගෝස්තු මස 13 වෙනි දින,
වවුනියාව දිසාපති කාර්යාලයේදීය.

8–1062—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් දැන්වීමයි

කොළඹ 5, කිරුළ පාරේ නො. 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති තැන විසින් පහත සඳහන් සැපයීම් සඳහා ඒවා ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙ.ව. 10 වනතුරු ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| | ටෙන්ඩරය | | අවසාන දිනය |
|---|---|---|---|
| 1. | ඇලුමිනියම් තහඩු සහ ඇක්ට්‍රෂන් | ... | 1969. 9.29 |
| 2. | බස් ජනෙල් සහ හුළං ආවරණ | ... | 1969. 9.30 |
| 3. | සාමාන්‍ය සහ ආරක්ෂක වීදුරු | ... | 1969.10. 1 |

ටෙන්ඩර් පත්‍ර නියමිත ලෙස ලියා අනුපිටපතකින් ද යුක්තව සකස් කොට එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර නිකුත් කරන්නේ කොළඹ 5, කිරුළ පාරේ නො. 200 වෙනි ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත එක් එක් ටෙන්ඩරය වෙනුවට රුපියල් 100 බැගින් තැන්පත් කර ඒ ඒ වෙනුවෙන් ලබාගන්නා ලද කුවිතාන්සිය මගේ කාර්යාලයට ඉදිරිපත් කළ විට ය. ඉහත සඳහන් දිනට පෙර දින දවල් 12 වනතුරු ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

මේ ටෙන්ඩර් සඳහා වැඩි විස්තර මාගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

සම්පාදක කොට්ඨාශය,
200, කිරුළ පාර,
කොළඹ 5,
1969 අගෝස්තු මස 10.

8–1135—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

## මන්නාරම් කච්චේරිය

### මන්නාරම් දිස්ත්‍රික්කයේ පාරවල් සෑදීම

මන්නාරම් දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1969 අගෝස්තු මස 26 වෙනි දින දහවල් 12 දක්වා මන්නාරම දිසාපති විසින් වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

(1) අංක 2 බී.ඕ.පී. පාර, පෙරියමඩු

2. මෙම වැඩ සඳහා 1969 අගෝස්තු මස 24 වැනි දින දක්වා මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති විසින් මන්නාරම කච්චේරියේදී නිකුත් කරනු ලබන ටෙන්ඩර් පෝර්ම, ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුතුව මන්නාරම දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි කරන ලද ටෙන්ඩර්කරුවන් සහ ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති ද මේ සඳහා සුදුස්සෝ වෙති. බාහිර ටෙන්ඩර්කරුවන් විසින් ඉල්ලුම් කරන විටදී, ඉල්ලුම් කරනු ලබන එක් එක් වැඩය වෙනුවෙන් රුපියල් 25 බැගින් මන්නාරම කච්චේරියේ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසු ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිතිවලට ද මෙසේ තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යය.

3. 1969.8.26 වැනි දින දහවල් 12 ට පෙර මන්නාරම දිසාපති වෙත ලිපි කවරයේ '' මන්නාරම දිස්ත්‍රික්කයේ පාරවල් සෑදීම සඳහා ටෙන්ඩර් '' යනු වෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ මන්නාරම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් දැමීමට ද පුළුවන. නියමිත දින නියමිත වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් ගැන සලකා බලනු නො ලැබේ.

4. 1969.8.26 වැනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලබන වේලාවේදී සියළුම ටෙන්ඩර්කරුවන්හට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. සතුටුදයක ටෙන්ඩර්කරුවන් හට ගිවිසුමකට බැඳෙන ලෙස ලියවිල්ල කින් දන්වනු ලැබේ. කොන්ත්‍රාත්තු කරනු ලබන මුදලින් සියයට 2 ක් (2%) සතුටුදයක ලෙස නිම කිරීමේ ඇප මුදලක් වශයෙන් ඔහු විසින් තැන් පත් කළ යුතුය. මෙසේ තබන ලද මුදල් සතුටුදයක ලෙස වැඩ නිම කරන තෙක් ආපසු ගෙවනු නොලැබේ. සතුටුදයක ටෙන්ඩර්කරුවන්හට මෙසේ දැනුම් දී දින 10 ක් ගත වීමට පෙර ඔහු ගිවිසුමකට බැඳීමට අපොහොසත් වුව හොත් ඔහුගේ තැන්පත් මුදල වන රුපියල් 25 රාජසන්තක කරනු ලැබේ.

6. නියම කරන ලද වැඩ ප්‍රමාණයෙන් සියයට අනූවක් (90%) වෙනු වෙන් මුදල් ගෙවනු ලැබේ. ඉතිරි සියයට 10 (10%) ඉහත 5 වැනි ඡෙදයෙහි දක්වා ඇති පරිදි තැන්පත් මුදලක් සමඟ සතුටුදයක අන්දමින් වැඩ නිමකර මාස තුනක් ගත වූ පසු ගෙවනු ලැබේ.

එස්. කතිර්කාමනාතන්,
මන්නාරම දිසාපති.

1969 අගෝස්තු මස 14 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේදීය.

8–1084—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## වාරිමාර්ග දෙපර්තමේන්තුව

### රත්මලානේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික අංශයේ ඇති ප්‍රයෝජනයට ගත නොහැකි මෝටර්රථ වාහන මිළදී ගෙන ඉවත්කර ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීමේ ප්‍රතිඵල

| විෂය අංකය | වාහනයේ විස්තරය | | ලැබුණු ටෙන්ඩර් ගණන | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය | ඉල්ලුම් කරන ලද මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| 1 ... | ටොන් 5 මැක්ලොරිය | අයිඩීඇල් 109 ... | 1 ... | ඩබ්ලිව්. ඒ. දිසානායක, 41 බැද්දේගාන පාර, කෝට්ටේ... | 1,712 | 0 |
| 2 ... | විලිස් වෙල්ඩින් වෑන්—සීජේ 3 ඒ | අයිඩීවී 56 ... | 3 ... | පී. බී. දිසානායක, 14, හරිස්චන්ද්‍ර මාවත, කොළඹ 7 ... | 1,500 | 0 |
| 3 ... | ඔස්ටින් ඒ 40 | අයිඩීවී 26 ... | 7 ... | ඒ. එච්. පී. සෙනෙවිරත්න, නයිනා ස්ටෝර්ස්, කිඹලගම, රාජාංගන | 2,795 | 0 |
| 4 ... | ටොන් 3½ පෝඩ් වී 8 ලොරිය | අයිඩීඇල් 125 ... | 5 ... | කේ. එස්. පෙරේරා, රත්ගොළුව, පොකුණුවත්ත, කොටුගොඩ | 2,444 | 0 |
| 5 ... | විලිස් පිකප් වෑන් 473 ඩබ්.ඩී. | අයිඩීවී 50 ... | 4 ... | එච්. කේ. ධර්මදස, 42, මීගමු පාර, පෑලියගොඩ ... | 2,000 | 0 |
| 6 ... | ටොන් 3½ ඩොජ් ප්ලාත්ට්සර්විස් ට්‍රක් | අයිඩීපීඇස්ටී 2 ... | 12 ... | ඇල්. එච්. සැම්සන් ද සිල්වා, 344, මාතර පාර, මාගාල්ල, ගාල්ල | 16,000 | 0 |
| 7 ... | ටොන් 3½—පෝඩ් වී. 8 ටිපර් | අයිඩීඇල් 166 ... | 2 ... | බී. ආර්. පෙරේරා, ලයිටන්, පලාතොට, කළුතර ... | 4,577 | 0 |
| 8 ... | ටොන් 2½—පෝඩ් වී.ඩී. ටිපර් | අයිඩීඇල් 87 ... | 8 ... | එම්. කේ. ලියනගේ, හපුගල්ල, වක්වැල්ල ... | 6,100 | 0 |
| | ටොන් 2½—පෝඩ් වී. 8 ටිපර් | අයිඩීඇල් 152 ... | 2 ... | එම ... | 5,600 | 0 |
| 9 ... | ඔස්ටින් ඩීසල් වතුර බවුසරය | අයිඩීඇල් 238 ... | 10 ... | ඩී. ජේ. ජයසුන්දර, 143, හයිලෙවල් පාර, මහරගම ... | 8,758 | 0 |
| 10 ... | ටොන් 3½ ඩොජ් ලොරිය | අයිඩීඇල් 79 ... | 4 ... | එස්. එම්. රාසික්, 63, ප්‍රින්සස්ගේට්, කොළඹ 12 ... | 5,255 | 0 |
| | ටොන් 3½ පෝඩ් වී. 8 ලොරිය | අයිඩීඇල් 157 ... | 4 ... | එම ... | 3,505 | 0 |
| | ටොන් 3½ ඔස්ටින් ලොරිය | අයිඩීඇල් 412 ... | 4 ... | එම ... | 4,505 | 0 |
| 11 ... | ටොන් 3½ පෝඩ් වී. 8 ලොරිය | අයිඩීඇල් 54 ... | 1 ... | පී. රාජු, 259, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 ... | 2,222 | 0 |
| | ටොන් 3½ පෝඩ් වී. 8 ලොරිය | අයිඩීඇල් 173 ... | 1 ... | එම ... | 2,779 | 0 |
| 12 ... | ඔස්ටින් ඒ. 70 | අයිඩීවී 30 ... | 4 ... | එස්. රන්ගයියා, 286 ඒ, ස්කිනර් පාර, කොළඹ 10 ... | 1,399 | 0 |
| 13 ... | සී.ජේ. 3 බී. විලිස් ජීප් රථය | 1340/සී ... | 3 ... | පී. බී. සිවරත්න, 7, 4 වෙනි හරස් වීදිය, කොළඹ 11 ... | 1,750 | 0 |
| | පෝඩ් කැනේඩියන්—ජංගම කම්හල | අයිඩීඇම්ඩබ්. 1 ... | 5 ... | එම ... | 16,000 | 0 |
| 14 ... | විලිස් සීජේ 3 ඒ ජීප් රථය | 1311/සී ... | 3 ... | පී. සුසෙයි අද්දිකාලම්, 290, 3ජ්, ස්කිනර්ස් පාර, කොළඹ 10 | 1,599 | 99 |
| | විලිස් යුනිවර්සල් සීජේ 5 ජීප් රථය | අයිඩීසී 77 ... | 6 ... | එම ... | 3,111 | 0 |
| | විලිස් සීජේ 5 ජීප් රථය | අයිඩීසී 106 ... | 5 ... | එම ... | 2,119 | 88 |
| | විලිස් සීජේ 5 ජීප් රථය | අයිඩීසී 108 ... | 7 ... | එම ... | 2,592 | 0 |
| | විලිස් සීජේ 5 ජීප් රථය | අයිඩීසී 136 ... | 12 ... | එම ... | 6,109 | 88 |
| | විලිස් පිකප් වෑන් සීජේ 3 බී—වෑන් රථය | අයිඩීවී 41 ... | 2 ... | එම ... | 1,399 | 0 |
| 15 ... | ටොන් 5 ඔස්ටින් වතුර බවුසරය | අයිඩීඇල් 268 ... | 2 ... | එම්. පරමජෝති, 276/5, දකුණු ස්කිනර් පාර, කොළඹ 10 | 10,789 | 0 |
| 16 ... | ටොන් 2½ ඩොජ් ටිපර් | අයිඩීඇල් 180 ... | 4 ... | කේ. එච්. ලියනගේ, 367/1, වක්වැල්ල, ගාල්ල ... | 6,500 | 0 |
| | ටොන් 2½ පෝඩ් වී. 8 ටිපර් | අයිඩීඇල් 187 ... | 4 ... | එම ... | 6,600 | 0 |
| 17 ... | චවර්ලට් වෑන්රථය 1959–3809 | අයිඩීවී 92 ... | 3 ... | එස්. සී. ඔබේසේකර, අයිලන්ඩ් වත්ත, වතුරගම (බ.ප.) ... | 6,150 | 0 |
| | විලිස් සීජේ 3ඒ | අයිඩීසී 70 ... | 2 ... | එම ... | 105 | 0 |
| 18 ... | ටොන් 3½ ඩොජ් ලොරිය | අයිඩීඇල් 68 ... | 11 ... | එස්. එස්. පාන්ඩියන්, 441/3, දකුණු ස්කිනර් පාර, කොළඹ 12 | 4,444 | 44 |
| | ටොන් 5 ඔස්ටින් ඩීසල් ලොරිය | අයිඩීඇල් 282 ... | 2 ... | එම ... | 2,555 | 0 |
| 19 ... | මොරිස් කොමර්ෂල් වතුර බවුසරය | අයිඩීඇල් 373 ... | 6 ... | ආර්. තංගදුරෙයි, 251/14, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10... | 11,399 | 99 |
| 20 ... | ටොන් 5 ඔස්ටින් වතුර බවුසරය | අයිඩීඇල් 266 ... | 1 ... | පී. එස්. මාරියන්, 251/3, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 | 8,688 | 0 |
| | ඔස්ටින් වතුර බවුසරය | අයිඩීඇල් 359 ... | 8 ... | එම ... | 11,088 | 0 |

| විෂය අංකය | වාහනයේ විස්තරය | | ලැබුණු ටෙන්ඩර් ගණන | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය | ඉල්ලුම් කරන ලද මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| 21 | ටොන් 3½ ඩොජ් ලොරිය | අයිඩීඇල් 70 | 1 | ටී. මාරිඅන්තෝනි, 209/6, දකුණු ස්කිනර් පාර, කොළඹ 10 | 3,599 | 0 |
| | ටොන් 3½ ඩොජ් ලොරිය | අයිඩීඇල් 73 | 3 | එම | 4,289 | 0 |
| | ටොන් 3½ පෝඩ් වී 8 ලොරිය | අයිඩීඇල් 129 | 3 | එම | 2,699 | 0 |
| | ටොන් 2½ පෝඩ් වී 8 ටිපර් | අයිඩීඇල් 189 | 9 | එම | 3,009 | 0 |
| | ටොන් 3½ ඔස්ටින් ඩීසල් ලොරිය | අයිඩීඇල් 241 | 9 | එම | 8,399 | 0 |
| | ටොන් 3½ ඔස්ටින් ලොරිය | අයිඩීඇල් 242 | 4 | එම | 4,589 | 0 |
| | ටොන් 3½ ඔස්ටින් ලොරිය | අයිඩීඇල් 244 | 4 | එම | 7,289 | 0 |
| | ටොන් 5 ඔස්ටින් ලොරිය | අයිඩීඇල් 264 | 5 | එම | 6,089 | 0 |
| 22 | ටොන් 3½ පෝඩ් වී 8 ලොරිය | අයිඩීඇල් 154 | 4 | එස්. කංගරාජා බාරේ, එම්. සිවසාමි, 59, කොටහේන | 3,399 | 0 |
| | ටොන් 2½ ඩොජ් ටිපර් | අයිඩීඇල් 177 | 7 | එම | 6,289 | 0 |
| | ටොන් 2½ පෝඩ් වී 8 ටිපර් | අයිඩීඇල් 188 | 1 | එම | 2,399 | 0 |
| 23 | ටොන් 5 ඔස්ටින් ඩීසල් ලොරිය | අයිඩීඇල් 285 | 4 | වී. සිත්තම්පරම්, 231/10, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 | 3,888 | 76 |
| 24 | ලැන්ඩ්රෝවර් ජීප් රථය | අයිඩීසී 96 | 8 | එස්. පී. සිවලිංගම්, 271, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 | 3,458 | 0 |
| | විලිස් සීජේ 5 ජීප් රථය | 1357/සී | 4 | එම | 1,555 | 0 |
| | ටොන් 3½ පෝඩ් වී 8 ලොරිය | අයිඩීඇල්/27 | 5 | එම | 3,600 | 0 |
| 25 | පෝඩ් කැනේඩියන් ජංගම කම්හල | අයිඩීඇම්ඩබ්. 2 | 6 | එස්. මදුරපෙරුම, කහතුඩුව | 20,501 | 0 |

එල්. ඕ. ද එස්. ගුණසේකර,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 7, 1969 අගෝස්තු මස 10 වෙනි දින.

8–1025—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ වාමස් තටාකයේ තැන්පත් පහත සඳහන් බඩු 1969 සැප්තැම්බර් මස 8 වෙනි දින පෙ.ව. 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 සැප්තැම්බර් මස 7 වෙනි දින එම් බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

ඇස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඩී/විකිණීම්/8,
1969 අගෝස්තු මස 14 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. සිමෙන්ති පල්ලූ සහිත කොට්ට 300 යි.
2. මිශ්‍ර පාටවලින් යුත් පී.වී.සී. කොම්පවුන්ඩ් පල්ලූ සහිත ගෝනි 234යි.
3. වියළි අඟුරු පල්ලූ ගෝනි 1යි.
4. වයර් රෝප්, ටී අයන්, රවුම් යකඩ, පැතැලි යකඩ සහ මිශ්‍ර යකඩ තොගයක්.

8–1104—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කිරි නිෂ්පාදනය සඳහා බෝ කිරීමට සුදුසු දෙනුන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කිරි නිෂ්පාදනය සඳහා සුදුසු දෙනුන් හා වැස්සියන් 200 ට අධික සංඛ්‍යාවක් අඹේවෙල හා බෝපත්තලාව රජයේ ගොවිපල් වලින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ඇත. ඔවුන්ගේ විස්තර පහත දක්වේ.

අඹේවෙල ගොවිපල (නුවරඑළියේ සිට සැතපුම් 6 කි)

දිනය හා වේලාව— 1969 සැප්තැම්බර් 2 දින පෙරවරු 10 ට
වර්ගය — අයර්ෂයර්
සංඛ්‍යාව — දෙනුන් 50 වැස්සියන් 80

බෝපත්තලාව රජයේ ගොවිපල (කලවකැලේ සිට සැතපුම් 17 කි)

දිනය හා වේලාව— 1969 සැප්තැම්බර් 9 දින පෙ. ව. 10 ට
වර්ගය — ෆ්‍රීසියන්, ජර්සි, අයර්ෂයර්, ෆ්‍රීසියන් දෙමුහුන්
සංඛ්‍යාව — දෙනුන් 45 වැස්සියන් 65

වෙන්දේසියෙන් මිළට ගන්නා සෑම සතෙකුගේම සම්පූර්ණ වටිනාකම මුදලින් එදින කළමනාකාරවරුන් වෙත ගෙවිය යුතු වේ. වෙන්දේසි දින අවසානයේදී ම මිළට ගත් සතුන් ගෙන යා යුතුය.

විකිණීමට ඇති සතුන් වෙන්දේසි කරන දිනයට පෙර දින උදේ 8 සිට 4 දක්වාත්, වෙන්දේසි දින උදේ 8 සිටත් පරීක්ෂා කර බැලිය හැකි වේ.

වෙනත් විස්තර කොළඹ 1, ඩියුක් විදියේ, බී. එස්. එස්. අයි. ගොඩ නැගිල්ලේ සත්ව පාලන නිළධාරිගෙන් විමසන්න. (දු. ක. 22454)

නි. අ. (සත්ව පාලන හා සෞඛ්‍ය).

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1284,
කොළඹ 1.

8–1081—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

## රජයේ දැන්වීමයි

1968.8.18 වෙනි දින, ප.ව. 1 ට දික්වැල්ලේ වෙරළේදී, "ඔරිමස්, නමැති මාලදිවයින් සුළුප්පුව වෙන්දේසියේ විකිණීමට අංක 14,866 සහ 69.8.8 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ පල කරණ ලද නිවේදනය මෙයින් අවලංගු කරමි.

එච්. බී. විරරත්න,
අතිරේක දිසාපති,
මාතර ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

8–420—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය—ගාල්ල

ගාල්ලේ රජයේ මහ රෝහලේ ඇති අබලන් භාණ්ඩ තොගයක් (පොදු භාණ්ඩ හා ශල්‍ය උපකරණ) එම රෝහලේ පාලන ගොඩනැගිල්ල අසලදී 1969 සැප්තැම්බර් මස 15 වෙනි දින පෙරවරු 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජයග්‍රාහී ඉල්ලුම්කරුවන් වෙන්දේසිය අවසන් වූ වහාම සම්පූර්ණ මුදල මුදලින්ම ගෙවා එදිනම රෝහලේ භූමියෙන් එකී භාණ්ඩ ඉවත් කර ගත යුතුය.

1969 සැප්තැම්බර් මස 14 වෙනි දින පෙරවරු 9 සිට පස්වරු 4 දක්වා වූ කාලය ඇතුලත ගාලු රෝහලේ ශල්‍ය උපකරණ ගබඩාවේ දී මෙකී භාණ්ඩ තොගය පරීක්ෂා කළ හැක. වෙන්දේසියේ විකිණීමට ඇති භාණ්ඩ සහ උපකරණ තොගයේ ලැයිස්තු මගේ කාර්යාලයෙන් හෝ ගාලු රෝහලේ වෛද්‍ය අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි අතර, ඔවුන්ගේ දැන්වීම් පුවරුවලද එකී ලැයිස්තු ප්‍රද්ර්ශනය කර ඇත.

වෛද්‍ය බී. ජී. ඩී. ප්‍රනාන්දු,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

1969 අගෝස්තු මස 8 වෙනි දින,
ගාල්ලේ, සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී ය.

8–1005—69.8.22 දින අංක 14,868 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1969**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ජූනි ... | 69. 6. 6 සිකුරාද | ... 69. 5.30 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.13 සිකුරාද | ... 69. 6. 6 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.20 සිකුරාද | ... 69. 6.13 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.27 සිකුරාද | ... 69. 6.20 සිකුරාද | ප.ව. 3.30 |
| ජූලි ... | 69. 7. 4 සිකුරාද | ... 69. 6.27 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.11 සිකුරාද | ... 69. 7. 4 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.18 සිකුරාද | ... 69. 7.11 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.25 සිකුරාද | ... 69. 7.18 සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු ... | 69. 8. 1 සිකුරාද | ... 69. 7.25 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8. 8 සිකුරාද | ... 69. 8. 1 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.15 සිකුරාද | ... 69. 8. 8 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.22 සිකුරාද | ... 69. 8.15 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.29 සිකුරාද | ... 69. 8.22 සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් ... | 69. 9. 5 සිකුරාද | ... 69. 8.29 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.12 සිකුරාද | ... 69. 9. 5 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.19 සිකුරාද | ... 69. 9.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.26 සිකුරාද | ... 69. 9.19 සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් ... | 69.10. 2 බ්‍රහස්පතින්ද | ... 69. 9.26 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද | ... 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.17 සිකුරාද | ... 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.24 සිකුරාද | ... 69.10.17 සිකුරාද | දවල් 12.00 |
| | 69.10.31 සිකුරාද | ... 69.10.24 සිකුරාද | දවල් 12.00 |
| නොවැම්බර් ... | 69.11. 7 සිකුරාද | ... 69.10.31 සිකුරාද | දවල් 12.00 |
| | 69.11.14 සිකුරාද | ... 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.11.21 සිකුරාද | ... 69.11.14 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.11.28 සිකුරාද | ... 69.11.21 සිකුරාද | ප.ව. 3.30 |
| දෙසැම්බර් ... | 69.12. 5 සිකුරාද | ... 69.11.28 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.12 සිකුරාද | ... 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 69.12.19 සිකුරාද | ... 69.12.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.26 සිකුරාද | ... 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණපිතයි